HRC/3252/24

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2026 . 06 . 02 |

වයි.නිසංසලා නවරත්න
ශ්‍රී සරණංකර මාවත,
කරච්ච
පිටිගල

*පැමිණිලි පාර්ශවය*

පී.ඒ.අයි. කසුන් කුමාර
සෙබල අංක XS 87574
කල්පිටිය නාවික හමුදා කඳවුර

*වින්දිත පාර්ශවය*

*එදිරිව*

1. එස්.ආර්.එම්.මධුෂාන්
   සෙබල අංක XR 117656
   නාවික කඳවුර ගැමුණු,
   වැලිසර.

2. එල්.එම්. සේනාධීර
   එස්.ටී.120419
   කන්කසන්තුරය උත්තර කඳවුර,
   නාවික හමුදාව

3. කමාන්ඩර් එම්.සී.මුණිදාස
   හිටපු අණභාර නිලධාරී
   නාවික චරිත ශෝධනාගාරය
   වැලිසර

4. එම්.යූ.සම්පත් කුමාර
   දවසේ කාර්ය භාර නිලධාරී
   නාවික චරිත ශෝධනාගාරය
   වැලිසර

5. පී.හර්ෂ වීරසිංහ
දවසේ කාර්ය භාර ජ්‍යෙෂ්ඨ නාවික
නාවික චරිත ශෝධනාගාරය
වැලිසර

6. නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදාව
(2,3,4.5 සහ 6 කොමිෂන් සභාවේ
බලතල ප්‍රකාරව නම් කරන ලද)

*වගඋත්තර පාර්ශවය*

පැමිණිලි අංකය : **HRC/3262/24**

පැමිණිල්ල :

පැමිණිලිකාරිය විසින් 2024.08.08 වන දින කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින්, කල්පිටිය නාවික හමුදා කඳවුරට අනුයුක්තව සේවය කරමින් සිටි තම ස්වාමිපුරුෂයා, කඳවුර තුළ ඇතිවූ සිද්ධියක් සම්බන්ධයෙන් පරීක්ෂණයක් සඳහා 2024.07.19 වන දින සිට වැලිසර නාවික හමුදා කඳවුරේ චරිත ශෝධනාගාරයේ රඳවා සිටි අවස්ථාවේ දී අමානුෂික පහරදීමකට ලක්ව ඇති බව සඳහන් කර ඇත. එහි ප්‍රශ්න කිරීම් අතරතුර සෙබල අංක එක්ස්.ආර් 117656 දරන එස්.ආර්.එම්. මධුෂාන් නැමැති නාවිකයා විසින් සිදු කරන ලද පහරදීම් හේතුවෙන් තම ස්වාමිපුරුෂයාගේ ඉදිරිපස දත් දෙකක් ගැලවී ගොස් නාවික හමුදා රෝහලෙන් ප්‍රතිකාර ලැබූ බවත්, මේ සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කළහොත් නාවික හමුදාව තුළ සේවය කිරීමට නොහැකි වන බවට අදාළ නාවිකයා විසින් තර්ජනය කළ බව සඳහන් කර ඇත. මෙම සිදුවීම සිදුවන අවස්ථාවේදී කමාන්ඩර් මුණිදාස, චීෆ් වීරසිංහ සහ චීෆ් කුමාර යන නිලධාරීන් මෙන්ම දඬුවම් ලැබීම සඳහා පැමිණි අනෙකුත් නාවිකයන් ද එම ස්ථානයේ සිට ඇති අතර, මෙම පහරදීම හේතුවෙන් ඊට පෙර මනා සෞඛ්‍ය තත්ත්වයෙන් සිටි තම ස්වාමිපුරුෂයා දැඩි ලෙස රෝගාතුර වී ඇති බැවින්, සිද්ධිය විධිමත් විමර්ශනයකට ලක්කර සාධාරණය ඉටු කරන ලෙසත් වන්දි මුදලක් ලබා දෙන ලෙසත් පැමිණිලිකාරිය සහනය වශයෙන් අපේක්ෂා කර ඇත.

පැමිණිලිකාරිය 2024.11.26 සහ 2025.01.02 යන දිනවල පැවති විමර්ශනවලදී මෙන්ම, 2025.02.23 දින පැවති විමර්ශනයේදී ද වැඩිදුර කරුණු ඉදිරිපත් කරමින් පවසා ඇත්තේ, 2025.01.22 වන දින බූස්ස කඳවුරේ රාජකාරි කරමින් සිටියදී තම ස්වාමිපුරුෂයාගේ පාදයක් අප්‍රාණික වී ඇති බවයි. නාවික හමුදා රෝහල වෙත ඇතුළත් කිරීමෙන් පසු වැඩිදුර ප්‍රතිකාර සඳහා පහසුකම් නොමැති බැවින් ඔහුව කරාපිටිය ශික්ෂණ රෝහල වෙත මාරු කර යවා ඇති අතර, එම රෝහලේ 58 වන වාට්ටුවේ නේවාසිකව ප්‍රතිකාර ලද බවයි. පළමු වගඋත්තරකරු විසින් කොන්ද ප්‍රදේශයට එල්ල කරන ලද පහරදීම හේතුවෙන් කශේරුකාවේ අස්ථි 03 කට හානි සිදුවී මෙම සයටිකා (Sciatica) රෝගී තත්ත්වය හටගෙන ඇති බව ඇය අවධාරණය කර ඇත. තවද, මෙම සිද්ධියට අදාළව නාවික හමුදා නිලධාරීන් විසින් තම ස්වාමිපුරුෂයා වෙත දුරකථන ඇමතුම් ලබා දෙමින් ඉදිරිපත් කර ඇති පැමිණිල්ල ඉල්ලා අස්කර ගන්නා ලෙස දන්වා බලපෑම් සිදු කරන බව ද පැමිණිලිකාරිය වැඩිදුරටත් සඳහන් කර ඇත.

වින්දිතගේ ප්‍රකාශය

2024.11.26 වන දින මානව හිමිකම් කොමිෂන් සභාවේදී පැවති විමර්ශනයේදී වින්දිත නායක නැවි පී.ඒ.අයි.කේ. කුමාර (එක්ස්.එස් 87574) ප්‍රකාශයක් ලබාදෙමින්, 2024.07.19 වන දින තමාව වැලිසර ගැමුණු චරිත ශෝධනාගාරය වෙත රැගෙන ගොස් එදින රාත්‍රී 20.00 ට පමණ සිරගත කළ බවත්, පසුදින එනම් 2024.07.20 දින අලුයම 05.30 ට පමණ මධුෂාන් නම් නාවිකයා විසින් තමාව සිරමැදිරියෙන්

පිටතට ගෙන සාමාන්‍ය දඬුවම්වලට අමතරව පොලු මුගුරු භාවිතයෙන් අමානුෂික ලෙස පහර දුන් බව සඳහන් කර ඇත. තවද මෙම පහරදීම සඳහා දඬුවම් ලබා ගැනීමට පැමිණි වෙනත් පිරිස් ද සම්බන්ධ වූ බවත්, දින දෙකක් පුරා අඛණ්ඩව සිදුකරන ලද මෙම පහරදීම් හේතුවෙන් පහර දීමට යොදාගත් සියලු පොලු පවා කැඩී ගිය බවයි. එසේම දිනය නිශ්චිතව මතක නොමැති වුවද අදාළ මස 20 හෝ 21 වන දිනක, මධුෂාන් යන අය රාත්‍රී 12.00 සිට පසුදින අලුයම දක්වා රාජකාරියේ නිරත වන බව පවසමින් ඔහුට තර්ජනය කර ඇති අතර, අදාළ දින මධ්‍යම රාත්‍රියේ සිට අලුයම දක්වා පැයෙන් පැයට පැමිණ නින්දක් ලබා නොදී, පරුෂ වචනයෙන් බැණ වදිමින් සහ වතුර ප්‍රහාර එල්ල කරමින් පීඩාකාරී ලෙස දඬුවම් පැමිණවූ බව සඳහන් කර ඇත.

එසේම පසුදින අලුයම 05.30 ට පමණ මධුෂාන් සහ සේනාධීර (දලයා) යන නාවිකයින් පැමිණ සිරමැදිරිය විවෘත කර තමාව බිම දිගා කරවා පහර දුන් බවත්, පසුව මධුෂාන් විසින් ඔහුව වෙනත් කාමරයකට රැගෙන ගොස් තමා කළ වරද කැගසා කියන ලෙස නියෝග කර, එසේ ප්‍රකාශ කරන විට මධුෂාන් නමැත්තා දැඩි කෝපයෙන් මෙන් වින්දිතයාගේ මුහුණට, හිසට සහ කම්මුලට පහර දී ඇති අතර, එම දැඩි පහරදීම හමුවේ මුඛයෙන් ලේ සමඟ දත් දෙකක් ගැලවී අතට වැටුණු බව වින්දිතයා සඳහන් කර ඇත. දත් ගැලවී ඇති බව පවසා පහරදීම නතර කරන ලෙස අයැද සිටියදී තමා ක්ලාන්ත වී ඇද වැටුණු බවත්, පසුව මධුෂාන් වතුර ලබා දී පිටව ගිය පසු අනෙක් නාවිකයින් පැමිණ තමාව පිරිසිදු කර තැබූ බවයි. උදෑසන 06.30 ට පමණ වමනය ගියද, උදෑසන 09.30 වන තෙක් කිසිදු වෛද්‍ය ප්‍රතිකාරයක් ලබා නොදුන් බවත්, පසුව කමාන්ඩර් මුණිදාසගේ නියෝග මත වෛද්‍යවරයා වෙත යොමු කෙරුණු බවයි. එහිදී වෛද්‍යවරයාට සත්‍ය හෙළි නොකරන ලෙස නිලධාරීන් උපදෙස් දුන්නද, තමා සත්‍ය ප්‍රකාශ කළ බවත්, පරීක්ෂා කළ දන්ත වෛද්‍යවරයා සහ හදිසි ප්‍රතිකාර ඒකකයේ වෛද්‍යවරයා විසින් තට්ටම් ප්‍රදේශයේ අභ්‍යන්තර ලේ ගැලීම් සහිත තැලීම් තත්ත්වයන් නිරීක්ෂණය කර ඔහුව හදිසි ප්‍රතිකාර ඒකකයට ඇතුළත් කළ බවත් ප්‍රකාශ කර ඇත.

තව ද රෝහල්ගතව සිටියදී පවා අත්විලංගු දමා ආරක්ෂක නිලධාරීන් යොදවා සිටි බවත්, අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් කිරීමට පෙර කමාන්ඩර් මුණිදාස විසින් පී.ඕ. ගුණසිංහ හරහා පණිවිඩ එවමින්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යොමු වුවහොත් දැනට පවතින දඬුවම ඉවත් කර නැවත දින 14 ක දඬුවමක් ලබා දෙන බවටත්, ඉදිරි වසර 06 ක සේවා කාලය තුළ ගැටලු ඇති කරන බවටත් තර්ජනය කළ බව සඳහන් කර ඇත. තවද කැප්ටන් ඩෝසන් විසින් ද තර්ජනාත්මක ප්‍රකාශ සිදු කළ බවත්, කෙසේ වෙතත් අධිකරණ වෛද්‍යවරයා හමුවේ තමා සත්‍ය ප්‍රකාශ කළ පසු මෙවැනි පහරදීමක් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගත යුතු බව වෛද්‍යවරයා අවධාරණය කළ බවත් ඔහු සඳහන් කර ඇත. දින 04 ක රෝහල් ප්‍රතිකාරවලින් පසු නැවත චරිත ශෝධනාගාරය වෙත යොමු කර ඇති අතර, එහිදී දින 14 ක කාලය අවසන් වී මුදා හැරීමට පෙර, තම කැඩුණු දත් කෘත්‍රිම දත් බව සඳහන් කරමින් බලහත්කාරයෙන් ප්‍රකාශයක් ලියා ගත් බවත් සඳහන් කර ඇත. 2025.02.21 දින පැවති විමර්ශනයට සහභාගී වෙමින් ඔහු වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කරමින්, මෙම පහරදීම හේතුවෙන් කොන්දේ ඇතිවූ ආබාධය නිසා දැනට කොඳු ඇට පෙළට ආරක්ෂක ආධාරකයක් (Back support) පැළඳ සිටින බවත්, සිද්ධියට පෙර ශාරීරික යෝග්‍යතා පරීක්ෂණ පවා සමත්ව මනා සෞඛ්‍යයෙන් සිටි තමාට වර්තමානයේදී අසුන්ගෙන සිදු කරන රාජකාරි හැර වෙනත් සක්‍රීය රාජකාරි සිදු කළ නොහැකි මට්ටමට පත්ව ඇති බවත් සඳහන් කර ඇත.

<u>වගඋත්තරකරුවන්ගේ කරුණු දැක්වීම</u>

01. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2024.08.15 දිනැති ලිපිය මගින් මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් සවිස්තරාත්මක වාර්තාවක් නාවික හමුදාධිපති වෙතින් කැඳවූ අවස්ථාවේදී , එන්එච්කියු/ එල්ඊජී/ එච්ආර්සී/ පීඑන්/එස්/882024 හා 2024.09.18 දිනැති ලිපිය මගින් නාවික හමුදාධිපති වෙනුවට මාණ්ඩලික නිලධාරී (නීති සේවා) අමානි/මාහි විසින්, පහරදීම සිදු කළ පුද්ගලයාගේ නම සහ නිල අංකය

පැහැදිලිව හඳුනාගෙන ඇති බැවින් නාවික හමුදාධිපතිවරයා මේ සඳහා වගඋත්තරකරුවෙකු කළ නොහැකි බවත්, අදාළ පහරදීම සිදු කළ පුද්ගලයා පෞද්ගලිකව කොමිෂන් සභාව හමුවේ පෙනී සිටිය යුතු හෙයින්, සිද්ධිය සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීමට නොහැකි බව දන්වා ඇති අතර, අදාළ සැකකාර නාවිකයා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට පමණක් එකඟතාව පළ කර ඇත.

02. නාවික හමුදා නීති නිලධාරියා විමර්ශන අවස්ථාවේදී අනුගමනය කරන ලද ගැටලුකාරී පිළිවෙත සම්බන්ධයෙන් 2025.04.02 වන දින කොමිෂන් සභාවේ සභාපතිතුමා සහ කොමසාරිස්වරයාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද විශේෂ විමර්ශනයේදී, පැමිණිල්ලට අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි බවට කර ඇති දැනුම්දීමෙන්, කොමිෂන් සභාවේ නියමයන් පැහැර හැරීමක් සිදුකර ඇති බව එදින සහභාගී වූ නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති සේවා) වෙත දැනුම් දෙමින් අදාළ වාර්තා ඉදිරිපත් කරන ලෙස දැනුම් දී තිබුණ ද, 2025.05.27 වන දින පවත්වන ලද විමර්ශනය වන විටත් ඒ සඳහා නිසි ප්‍රතිචාරයක් නොමැති හෙයින්, කොමිෂන් සභාවේ නියෝග සහ විධානයන් මෙලෙස පැහැර හැරීම පිළිබඳව සිදු කරන ලද අවධාරණයෙන් අනතුරුව, නාවික හමුදාව විසින් 2025.06.11 දිනැති අංක එන්එච්කියු/ එල්ජී/ එච්ආර්සී/ පීජීඑන්/එස්/88/2024 දරන ලිපිය මගින් කරුණු දැක්වීමක් සිදුකර ඇත.

එමගින් සඳහන් කර ඇත්තේ, පැමිණිලිකාරියගේ ස්වාමිපුරුෂයා වන අංක එක්ස්.එස්. 87574 දරන නායක නැවි පී.ඒ.අයි.කේ. කුමාර විසින් සිදු කරන ලද නාවික වරදකට වරද පිළිගැනීම මත, නාවික හමුදා පනතේ 28 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික නෞකා විජය ආයතනයේ අණදෙන නිලධාරියා විසින් 2024 මැයි මස 13 වන දින ඔහුව වරදකරු කර, 2024 ජූලි මස 19 වන දින සිට දින 14 ක කාලයක් සඳහා වැලිසර නාවික චරිත ශෝධනාගාරය වෙත යොමු කර ඇති බවයි. තව ද මෙම පැමිණිල්ලට අනුව අදාළ පහරදීම සිදුව ඇත්තේ චරිත ශෝධනාගාරය තුළ බව නිරීක්ෂණය වන බවත්, එම සිද්ධියට අදාළව මේ වන විට වැලිසර මහේස්ත්‍රාත් අධිකරණයේ අංක බී/3598/24 දරන නඩුව විභාග වෙමින් පවතින බවයි.

තවදුරටත් එම ලිපිය මගින්, 1994.01.28 දිනැති අංක 803/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 11 වන වගන්තිය ප්‍රකාරව, දඬුවම් නියම වූ නාවික පුද්ගලයන් විසින් වරින් වර නියම කරනු ලබන බර වැඩ හා සරඹ සිදු කළ යුතු බවත්, ඒ අනුව නාවික චරිත ශෝධනාගාරයක් තුළ බලයලත් පුද්ගලයෙකුට රැඳවියන් ලවා බර වැඩ සහ දඬුවම් සරඹ කරවීමේ බලයක් හිමි වන හෙයින් එවැනි විධිමත් දණ්ඩනයකට ලක් කිරීම සම්බන්ධයෙන් නාවික හමුදාධිපතිවරයා වගකීමට ලක් නොවන බවත්ය. කෙසේ වෙතත්, පැමිණිල්ලේ සඳහන් පරිදි වගඋත්තරකාර නාවිකයා විසින් පහරදීමක් සිදු කර ඇත්නම් ඒ සම්බන්ධයෙන් ඔහු පෞද්ගලික මට්ටමින් වගකීමට ලක් විය යුතු බැවින් ස්වකීය චිත්ති වාචකය ඉදිරිපත් කළ යුතු බව සඳහන් කර ඇත.

03. පළමුවන වගඋත්තරකරු - සාමාන්‍ය නැවි මනෝජ් මධුෂාන් (සෙබල අංක එක්ස්.ආර් 117656)

2025.02.21 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති විමර්ශනය සඳහා සහභාගී වූ වගඋත්තරකාර සාමාන්‍ය නැවි මනෝජ් මධුෂාන්, මෙම විමර්ශනයේ මූලික අවස්ථාවේදී විමර්ශන නිලධාරී ඉදිරියේ දී පැමිණිල්ලේ සඳහන් කර ඇති වරද පිළිගනිමින්, සිද්ධිය වූ දින ඔහු නාවික චරිත ශෝධනාගාරය තුළ රාජකාරියේ නිරත වූ බවත්, එහිදී වින්දිත නාවිකයාට ඔහු විසින් පහරදීමක් සිදු කළ බවත් සඳහන් කර ඇත. වින්දිතයා එදින කෘත්‍රිම දත් දෙකක් පැළඳ සිටි බවත්, ඔහු සිදුකළ පහරදීම හේතුවෙන් එම දත් දෙක කැඩී ගිය බවත් සඳහන් කර ඇත. එදින තම ඉහළ නිලධාරියා ලෙස කමාන්ඩර් මුණිදාස කටයුතු කළ බවත්, පහරදීමෙන් විනාඩි 15 කට පමණ පසු වින්දිතයා අපහසුතාවයට පත්ව සිටියදී නාවික හමුදා රෝහලට ඇතුළත් කිරීමට පියවර ගත් බවත් ප්‍රකාශ කර ඇත. තමාට පැවරී තිබුණේ

රැඳවියන් නිරීක්ෂණය කිරීම පමණක් වුවද, කිසිවෙකුගේ අනුබලයක් නොමැතිව තමා විසින්ම මෙම පහරදීම සිදු කළ බව වගඋත්තරකරු මුලින් ප්‍රකාශ කර ඇත.

කෙසේ වෙතත්, මෙම විමර්ශන ක්‍රියාවලිය අතරතුර නාවික හමුදාධිපති නියෝජනය කරමින් පැමිණ සිටි ලුතිනන් කමාන්ඩර් ඩබ්.ජී. රොද්‍රිගෝ මහතා වෙත ලැබුණු දුරකථන ඇමතුමක් හේතුවෙන් ඔහු විමර්ශන කාමරයෙන් පිටතට ගොස් නැවත පැමිණීමෙන් අනතුරුව, ඔහු මනෝජ් මධුෂාන්ගේ සේවාදායකයා වශයෙන් ඔහු පෙනී සිටින බැවින් ඔහුට පෞද්ගලිකව උපදෙස් ලබා දිය යුතු බව සඳහන් කර වගඋත්තරකරු විමර්ශන කාමරයෙන් පිටතට රැගෙන ගොස් සාකච්ඡා කිරීමට නීති නිලධාරියා කටයුතු කර ඇත. අනතුරුව නැවත පැමිණි එම නිලධාරියා, මෙය කොමිෂන් සභාවක් මිස අධිකරණයක් නොවන බවත්, ලබා දී ඇති ප්‍රකාශ ඕනෑම අවස්ථාවක වෙනස් කළ හැකි බවත් පවසමින් මෙම ගැටලුව අධිකරණය හරහා විසඳා ගැනීමට අවස්ථාව ලබා දෙන ලෙස ප්‍රකාශ කර ඇත. ඔහුගේ මෙම මැදිහත්වීමෙන් සහ උපදෙස් ලැබීමෙන් පසු වගඋත්තරකරු පෙර ලබාදුන් ප්‍රකාශයට සම්පූර්ණයෙන්ම පටහැනි නව ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත.

එලෙස උපදෙස් ලැබීමෙන් පසුව වගඋත්තර සාමාන්‍ය නැවි මනෝජ් මධුෂාන් සිය සංශෝධිත ප්‍රකාශය මගින්, ඔහු 2024.07.19 දින (දිනය නිශ්චිත නොවන බව සඳහන් කර ඇත) චරිත ශෝධනාගාරයේ රාජකාරි කරමින්, දඬුවම් ලැබූ නාවිකයන්ගේ බඩු බාහිරාදිය පරීක්ෂා කරමින් සිටි බවත්, වින්දිත නායක නැවි කුමාර තෙල් ලීටර් 580 ක් අවභාවිතා කිරීමේ වරදකට දින 14 ක දඬුවම් ලබා පැමිණ සිටි බවත්, තමා ඔහුට විනාඩි 20 ක් පමණ කාලයක් ඩිප් ගැසීම සහ දිවීම වැනි දඬුවම් සරඹ පමණක් ලබා දුන් බව සඳහන් කර ඇත. තව ද එම සරඹ අතරතුර වින්දිතයා දත් දෙකක් අතට ගෙන පෙන්වූ බවත්, ඒවා සිවිල් ජීවිතයේදී සිදුවූ අනතුරක් නිසා දැමූ කෘත්‍රිම දත් බවත්, සරඹ අතරතුර ඒවා ඉබේ ගැලවී ගිය බවත් සඳහන් කර ඇත. ඉන්පසු වින්දිතයා කාමරය අසල හිඳුවා කමාන්ඩර් මුණිදාසට දැනුම් දී රෝහල් ගත කළ බවත්, මේ සිදුවීම හේතුවෙන් තමාගේ රාජකාරි ස්ථානය වෙනස් කර ප්‍රධාන දොරටුවට මාරු කළ බවත්, තමාට එරෙහිව පරීක්ෂණ මණ්ඩලයක් (BOI) ක්‍රියාත්මක වන බවත් ඔහු වැඩිදුරටත් සඳහන් කර ඇත.

වගඋත්තරකරුගේ මෙම නව ප්‍රකාශය අනුව කරුණු විමසීමේ දී, චරිත ශෝදනාගාරය සඳහා රැඳවියන් ඇතුළත් කරගැනීමේදී හෘද ස්පන්දනය වැනි මූලික පරීක්ෂණ රෝහල තුළින් සිදු කළද, වින්දිතයාගේ මුඛය හෝ දත් පරීක්ෂා නොකළ බවත්, වින්දිතයා රෝහල් ගත කිරීමට හේතුව ලෙස ලේ ගැලීමක් නොව දත් ගැලවීම පමණක් බවත්, තමා මීට පෙර "පහරදුන්" බවට ප්‍රකාශ කළේ දඬුවම් සරඹ ලබා දීම අදහස් කරමින් බවත් සඳහන් කරමින් මෙම සිද්ධිය සාධාරණීකරණය කිරීමට ඔහු උත්සාහ කර ඇත.

**04.** දෙවන වගඋත්තරකරු - එල්.එම් සේනාධිර (සෙබල අංකය එස්ටී **120419**)

සිද්ධියට අදාළව 2025.09.10 දින ප්‍රකාශයක් ලබාදෙමින්, පැමිණිල්ලට අදාළ සිදුවීම වන දිනයේ ඔහු නාවික චරිත ශෝධනාගාරය තුළ දින 45 ක කාලයක් සඳහා දඬුවම් විඳිමින් සිටි බව සඳහන් කර ඇත. එසේම වැඩි දින ගණනක් දඬුවම් ලැබීමට නියමිතව සිටි බැවින් ඔහුව "දළයා" යන අන්වර්ථ නාමයෙන් හඳුන්වා ඇති බවත්ය. සිද්ධිය වූ දින උදෑසන 05.30 ට පමණ සිරමැදිරියෙන් ඔහු ඇතුළු සිව් දෙනෙකු පිටතට ගත් බවත්, එහිදී වින්දිත සහ ඔහුව දඬුවම් සරඹ සඳහා මිදුල වෙත රැගෙන ගිය බවයි. එම අවස්ථාවේදී අදාළ විනය ආරක්ෂක නාවිකයා (නම අමතක බව සඳහන් කර ඇත) විසින් වින්දිත නායක නැවි කුමාර ඒ අසල වූ කාමරයක් වෙත රැගෙන ගිය බවත්, විනාඩි 05 කට පමණ පසු එම විනය ආරක්ෂක නාවිකයා පමණක් කාමරයෙන් පිටතට පැමිණි බව සඳහන් කර ඇත. අනතුරුව එළියේ සිටි අයෙකු වින්දිත නායක නැවි කුමාර බිම වැටී සිටින බව පැවසීම හේතුවෙන්, ඔහු ගොස් බැලීමේදී

වින්දිතයා බිම වැටී සිටිනු දුටු බවත්ය. ඒ වන විට වින්දිතයාගේ මුඛයෙන් රුධිරය වහනය වෙමින් තිබූ අතර, දත් දෙකක් ගැලවී ඔහුගේ අතේ තිබූ බවත්, අනතුරුව ඔහුව ඔසවා මේසයක් මත තබා එහි භාරව සිටි ජ්‍යෙෂ්ඨ නාවිකයා (නම නොදනී) දැනුවත් කර රෝහල් ගත කිරීමට කටයුතු කළ බව සඳහන් කර ඇත.

වින්දිත නායක නැවි කුමාර විසින් ලබා දී ඇති ප්‍රකාශයේ දෙවන වගඋත්තරකරු සිරමැදිරියේ දොර විවෘත කර වින්දිතට පහර දුන් බවට එල්ල කර ඇති චෝදනාව සම්බන්ධයෙන් විමසීමේදී, සාමාන්‍ය නැවි එල්.එම්. සේනාධිර අදාළ විනය ආරක්ෂක නාවිකයා විසින් කොසු මිටක් වැනි පොල්ලකින් වින්දිතයාට පහර දුන් බව සඳහන් කර ඇති අතර, දඬුවම් ලැබීම සඳහා ඔහු ද පිටතට ගෙන සිටි මෙම අවස්ථාවේදී අදාළ විනය ආරක්ෂක නාවිකයා විසින් තමාට ද වින්දිතට පහර දෙන ලෙස නියෝග කළ බැවින්, තමා වින්දිතයාට පොල්ලකින් එක් පහරක් එල්ල කළ බව සඳහන් කර ඇත. එසේ වුවද, තමා පහර දුන් අවස්ථාවේදී වින්දිතයාගේ දත්වලට හානි සිදු නොවූ බවත්, දත් කැඩීමට හේතු වූ බරපතල පහරදීම සිදු වූ අවස්ථාව ඇසින් නොදුටු බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත

**05. තෙවන වගඋත්තරකරු- කමාන්ඩර් එම්.සී.මුණිදාස අණභාර නිලධාරියා , නාවික චරිත ශෝධනාගාරය, වැලිසර**

2026.03.12 වන දින පැවති විමර්ශනයේ දී ප්‍රකාශයක් ලබා දෙමින්, සිද්ධිය වූ කාලසීමාව තුළ ශ්‍රී ලංකා නාවික නෞකා 'ගැමුණු' (වැලිසර) ආයතනයට අනුයුක්තව නාවික චරිත ශෝධනාගාරයේ අණභාර නිලධාරියා වශයෙන් මෙන්ම වැලිසර විනය ආරක්ෂක රාජකාරි නිලධාරියා (Provost Officer) වශයෙන් ද රාජකාරි කළ බව සඳහන් කර ඇත. 2024.07.22 දින පෙරවරු 08.00ට තමා සාමාන්‍ය පරිදි කාර්යාලයට වාර්තා කළ බවත්, එහිදී පැමිණි පුද්ගලයෙකු විසින් රැඳවියෙකු නාන කාමරය තුළ ඇද වැටී ඇති බවත් ඔහුගේ තොල් ඉදිමී ඇති බවත් තමාට දැනුම් දුන් බවයි. එම අවස්ථාව වන විට වින්දිතයා තම කාර්යාලයෙන් පිටත රැඳී සිටි බවත්, ඔහුගේ තොල් ඉදිමී තිබෙන අයුරු තමා දුටු බවත් වගඋත්තරකරු සඳහන් කර ඇත.

වින්දිතයා සිය කාර්යාලය තුළට කැඳවා සිද්ධිය පිළිබඳ විමසීමේදී, ඔහු නාන කාමරයේ ඇද වැටුණු බව දිගින් දිගටම ප්‍රකාශ කළ බවත්, එම අවස්ථාවේදී ඔහුගේ ඉදිරිපස දත් දෙකක් නොමැති බව තමා දුටු බවත් සඳහන් කර ඇත. වැටීමක් හේතුවෙන් දත් දෙකක් අහිමි වීම බරපතල කාරණයක් බැවින් ඒ පිළිබඳව විමසීමේදී, වින්දිතයා ඒවා කෘත්‍රිමව සකස් කරන ලද දත් බව පැවසූ බවත් ඔහුට කිසිදු අපහසුතාවයක් නොමැති බව සඳහන් කළ බවත් ප්‍රකාශ කර ඇත. වින්දිතයාගේ පවුලේ ඥාතීන් දැනුවත් කිරීමට අවශ්‍ය දැයි විමසූ අවස්ථාවේදී, ඔහු චරිත ශෝධනාගාරයේ සිටින බව පවුලේ අය නොදන්නා බවත් පාඨමාලාවකට සහභාගී වී සිටින බව ඔවුන්ට පවසා ඇති බැවින් මේ පිළිබඳව ඔවුන් දැනුවත් කිරීමට අවශ්‍ය නොවන බව වින්දිතයා ප්‍රකාශ කළ බව සඳහන් කර ඇත.

වින්දිතයාව දන්ත වෛද්‍ය කපිතාන් රණසිංහ වෙත යොමු කිරීමෙන් අනතුරුව, වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර එම දත් කෘත්‍රිම ඒවා බව තහවුරු කළ බවත් ඒ සම්බන්ධයෙන් ගැටලුවක් නොවන හෙයින් වින්දිතයාව සාමාන්‍ය වාට්ටුවකට ඇතුළත් කළ බවයි. මෙම සිදුවීම පිළිබඳව ශ්‍රී ලංකා නාවික නෞකා 'ගැමුණු' ආයතනයේ අණදෙන නිලධාරියා සහ විනයාරක්ෂාධිපති (Provost Marshal) දැනුවත් කිරීමට ඔහු කටයුතු කළ බව ද, රෝහල්ගතව සිටියදී ද වින්දිතයාගේ සුවදුක් විමසූ බවත්, එහිදී ද වින්දිතයා කියා සිටියේ ඔහුට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමට අවශ්‍ය නොවන බව වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

නාවික චරිත ශෝධනාගාරයේ දෛනික ක්‍රියාවලිය පිළිබඳව විමසීමේදී වගඋත්තරකරු, රැඳවියන් උදෑසන 05.30ට අවදි වී පිරිසිදු කිරීමේ කටයුතු සහ 07.00 ට පෙරට්ටුවට සහභාගී විය යුතු බවද,

අනතුරුව දෛනික සරඹ සහ පිරිසිදු කිරීමේ රාජකාරිවල නිරත වන අතර, රාත්‍රී 08.00 ට ඔහු හෝ සිය කනිෂ්ඨ නිලධාරියෙකු විසින් සියලු රැඳවියන් පරීක්ෂාවට ලක් කරන බවයි. ජූලි 22 වන දින දෛනික නියෝග ලේඛනයෙන් සාමාන්‍ය නැවි මධුෂාන් යන අයව රැඳවුම් මැදිරි රාජකාරිවලින් ඉවත් කිරීමට හේතු විමසූ අවස්ථාවේදී වගඋත්තරකරු, චරිත ශෝධනාගාරයේ පවතින සම්ප්‍රදායික සරඹයක් (තමා කළ වරද හඬ නගා ප්‍රකාශ කිරීමේ සරඹය) වින්දිතයා ලවා කරවීමට මධුෂාන් නියමිතව සිටිය ද, මෙම සිදුවීම සම්බන්ධයෙන් ඔහු තමා දැනුවත් කර නොතිබීම හේතුවෙන් විනයාරක්ෂාධිපතිගේ උපදෙස් මත ඔහුව එම රාජකාරියෙන් ඉවත් කර SLNS 'ගැමුණු' ප්‍රධාන දොරටුවේ රාජකාරි සඳහා යෙදවූ බව ප්‍රකාශ කර ඇත.

සාමාන්‍ය නැවි මධුෂාන් විසින් සිදු කළ පහරදීම සම්බන්ධයෙන් ඔහු දැනුවත් වී නොසිටි බවත්, කනිෂ්ඨ නිලධාරීන්ගෙන් ඒ පිළිබඳව විමසීමේදී ද එවැනි පහරදීමක් ගැන කරුණු අනාවරණය නොවූ බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. වින්දිතයා රෝහල්ගත කිරීමට පැය 3 කට අධික කාලයක් ගතවීමට හේතු විමසීමේදී, පෙරවරු 08.00ට සිද්ධිය දැනගත් වහාම අණදෙන නිලධාරියා දැනුවත් කර අවශ්‍ය පියවර ගත් බවයි. වින්දිතයාට අධිකරණ වෛද්‍යවරයා හමුවේ සත්‍ය හෙළි නොකරන ලෙස හෝ දඬුවම් කාලය වැඩි කරන බවට පී.ඕ. ගුණසිංහ හරහා තර්ජනය කිරීම සහ දත් කෘත්‍රිම බවට බලහත්කාරයෙන් ප්‍රකාශ ලබා ගැනීමට අනුබලදීමේ චෝදනාව ප්‍රතික්ෂේප කර ඇති අතර, දඬුවම් කාලය තීරණය කිරීම ඔහුගේ පාලනයෙන් බැහැර නෛතික කටයුත්තක් බව ද සඳහන් කර ඇත.

## 5. හතරවන වගඋත්තරකරු- මුණසිංහගේ උදාර සම්පත් කුමාර ( දවසේ කාර්ය භාර නිලධාරි)

2026.02.12 වන දින ප්‍රකාශයක් ලබා දෙමින්, 2024.02.10 වන දින වැලිසර නාවික චරිත ශෝධනාගාරයේ පරිපාලන නිලධාරියා වශයෙන් රාජකාරි භාරගෙන 2024.08.02 දින දක්වා එහි සේවය කළ බව සඳහන් කර ඇත. නාවික චරිත ශෝධනාගාරයේ දෛනික ක්‍රියාවලිය පිළිබඳව කරුණු දක්වමින් ඔහු සඳහන් කළේ, දඬුවම් නියම වූ නාවිකයෙකු එහි පැමිණීමෙන් පසු මූලිකවම විනාඩි 30ක ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයක් සිදුකරන බවයි. සාමාන්‍යයෙන් උදෑසන 04.30ට කටයුතු ආරම්භ කරන බවත්, 05.00 සිට 06.30 දක්වා ශරීර සුවතා කටයුතු වලින් පසු 08.00 වන විට අංක 06 නිල ඇඳුමින් සැරසී පෙරටවුවට ඉදිරිපත් විය යුතු බවත්, එහිදී සරඹ උපදේශකවරයෙකු හෝ එදින රාජකාරි සිදුකරන නාවිකයෙකු මඟින් සරඹ ලබාදෙන බවත්ය. ඉන් අනතුරුව පිරිසිදු කිරීමේ කටයුතුවල රැඳවියන් යොදවන අතර, දහවල් 12.00 ට ආහාර ගැනීමෙන් පසු පස්වරු 01.45ට ආරම්භ වන දඬුවම් සරඹ පැයක කාලයක් ලබාදෙන බවත්, ඒ සඳහා Push-ups, Patrol සහ Rolling වැනි ක්‍රියාකාරකම් ඇතුළත් වන බවත්ය. පස්වරු 06.30ට ආගමික වතාවත්වලින් පසු රාත්‍රී 08.00ට දවසේ කාර්යභාර නිලධාරියාගේ පරීක්ෂාවෙන් පසුව රාත්‍රී 10.00 ට රැඳවියන් රැඳවුම් ස්ථාන තුළට ඇතුළු කරන බව ද සඳහන් කර ඇත.

වින්දිතයාට පහරදුන් බව කියන අවස්ථාවේ එම ස්ථානයේ සිටි බවට වන චෝදනාව ප්‍රතික්ෂේප කළ වගඋත්තරකරු, පෙර දින රාත්‍රී වාරිකා වාරයෙන් අනතුරුව ඔහු නිල ලැගුම් නිවාසයේ රැඳී සිටි බව සඳහන් කර ඇත. එදින පෙරවරු 07.45ට රාජකාරියට වාර්තා කළ අවස්ථාවේදී බලනැවි මධුෂාන් පැමිණ උදෑසන ශරීර සුවතා කටයුතුවලින් පසු වින්දිතයාගේ දතක් රිදෙන බව ඔහුට පැවසූ බවත්, ඒ අනුව ඔහු රැඳවියන් විවේක ගන්නා ස්ථානයට ගිය අවස්ථාවේ වින්දිතයා ඇඳක වැතිරී සිටිනු දුටු නමුත් ඔහුගෙන් කිසිදු ප්‍රශ්න කිරීමක් සිදු නොකළ බවත්ය. වින්දිතයා එම අවස්ථාවේදී සිය අතින් මුඛය වසාගෙන සිටි බැවින් ඔහු එවැනි පහරදීමක් හෝ රුධිරය වහනය වීමක් නිරීක්ෂණය නොකළ බවත්, 1991 නාවික හමුදා රැඳවුම් නියෝග 36 ප්‍රකාරව ඒ පිළිබඳව රැඳවුම් ජර්නලයේ සටහනක් තැබුවේද යන්න තමාට මතක නොමැති බවත් ප්‍රකාශ කර ඇත.

වින්දිතයාව රෝහල්ගත කිරීමට පැය තුනකට අධික කාලයක් ගතවීමට හේතුව විමසීමේදී වගඋත්තරකරු, ඔහු මෙම සිද්ධිය දැනගත් වහාම චරිත ශෝධනාගාරයේ අණභාර නිලධාරියා දුරකථනයෙන් දැනුවත් කළ බවත්, ඔහු පෙරවරු 08.00ට පැමිණි පසු වින්දිතයා සහ මධුෂාන් යන අයව සිය කාර්යාලයට කැඳවා කරුණු විමසනු දුටු බවත් සඳහන් කර ඇත. වින්දිතයාට එරෙහිව කිසිදු ක්‍රියාමාර්ගයක් නොගන්නා ලෙස හෝ දඬුවම් කාලය වැඩි කරන බවට තර්ජනය කිරීමක් ඔහු විසින් සිදු නොකළ බවත්, එවැනි බලතල තමා සතුව නොමැති බවත්ය. තවද, දෛනික නියෝග පත්‍රයේ මධුෂාන්ගේ රාජකාරි වෙනස් කිරීමටත්, රෝහල් රාජකාරි අතින් සටහන් කිරීමටත් හේතුව විමසීමේදී ඔහු කියා සිටියේ, වින්දිතයාව රෝහල්ගත කිරීම සඳහා නිලධාරීන් අනුයුක්ත කිරීමට අවශ්‍ය වූ බැවින් එසේ සිදුකළ බවත්, රාජකාරි වෙනස් කිරීමේ තීරණ ගනු ලබන්නේ අණභාර නිලධාරියා වන කමාන්ඩර් මුණිදාස මහතා විසින් බවත්ය. වින්දිතයාට පොලු මගින් පහරදීම පිළිබඳව ඔහු කිසිවක් නොදන්නා බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

### 6. පස්වන වගඋත්තරකරු- ප්‍රදීප් හර්ෂ වීරසිංහ (දවසේ කාර්ය භාර ජ්‍යෙෂ්ඨ නාවික)

2026.02.12 වන දින කොමිෂන් සභාව හමුවේ ප්‍රකාශයක් ලබා දෙමින්, ඔහු නාවික හමුදාවේ රාජකාරි කරනු ලබන බවත් නාවික චරිත ශෝධනාගාරයේ පවතින දෛනික ක්‍රියාපටිපාටිය පිළිබඳව දැනුවත් බවත් සඳහන් කර ඇත. නාවික හමුදා පනත ප්‍රකාරව දඬුවම් නියම වූ නාවිකයෙකු චරිත ශෝධනාගාරය වෙත පැමිණි මුල් දිනයේදී ඔහුට දඬුවම් කිරීමක් සිදු නොකරන බවත්, සති අන්ත, පෝය හෝ වෙනත් නිවාඩු දිනවලදී ද දඬුවම් පැමිණවීමක් සිදු නොකරන බවත් සඳහන් කර ඇත. කඳවුරේ අණභාර නිලධාරියා විසින් ලබා දී ඇති දෛනික නියෝග මාලාවට අනුකූලව නාවිකයන් වෙත දඬුවම් සරඹ ලබාදීම සිදුකරන බවත්, තමා උදෑසන 08.00ට රාජකාරි භාරගත් බවත් ප්‍රකාශ ක ඇත. රැඳවියන් උදෑසන 06.15 - 06.30 කාලසීමාව තුළ සිරමැදිරිවලින් පිටතට ගෙන ඔවුන් රැඳී සිටින නිවාසයේදී (Dormitory) දඬුවම් සරඹ සඳහා සූදානම් කරන බවත්, එහිදී ද ඔවුන්ට යම් දඬුවම් සරඹ ලබාදෙන බවත්ය. එම අවස්ථාවලදී අදාළ ස්ථානයේ සිටින දඬුවම් ලබන අයගේ කණ්ඩායම් නායකයා සහ රාජකාරි නිලධාරියා ඒ පිළිබඳව අධීක්ෂණය කරන බවත්, මෙම සිදුවීම සිදුව ඇත්තේ එවැනි අවස්ථාවක බවත් ඔහු සඳහන් කර ඇත.

සිද්ධිය වූ අවස්ථාවේ ඔහු නිවසනයේ සිටි බවත්, චරිත ශෝධනාගාරයේ දෛනික කටයුතු පිළිබඳව විස්තර කරමින් ඔහු සඳහන් කළේ, උදෑසන 08.00 සිට 08.30 දක්වා අංක 06 නිල ඇඳුමින් ඩ්‍රිල් (Drill) කටයුතු සිදුකරන බවත්, දහවල් ආහාරයෙන් පසු පස්වරු 01.45 සිට 02.45 දක්වා ඩිප්ස්, දිවීම්, රෝලින් සහ ෆෝව්රෝල් වැනි දඬුවම් සරඹ ඔහු විසින් හෝ සරඹ උපදේශකවරයෙකු විසින් ලබාදෙන බවත්ය. තමා පෙරවරු 08.00ට ආසන්න වේලාවක රාජකාරියට පැමිණි අවස්ථාවේදී බලනැව් මධුෂාන් විසින් සිදුවීම පිළිබඳව ඔහු දැනුවත් කළ බවත්, එහිදී උදෑසන සරඹ ලබාදීමේදී වින්දිතයාගේ පෙර සකස් කරන ලද කෘත්‍රිම දතක් ගැලවී ඇති බව ඔහු පැවසූ බවත්ය. ඔහු යන අවස්ථාව වන විට වින්දිතයා රැඳවුම් නිවාසයේ බිම දිගා වී සිටි බවත්, වින්දිතයාගේ මුඛයෙන් රුධිරය වහනය වන අයුරු ඔහු දුටු බවත්ය. අනතුරුව අණභාර නිලධාරියා දැනුවත් කර වින්දිතයාව රෝහල්ගත කිරීමට කටයුතු කළ බවයි.

වින්දිතයාව රෝහල්ගත කිරීමට පැය තුනක කාලයක් ප්‍රමාදවීට හේතු වශයෙන්, වින්දිතයා විසින් අපහසුතාවයක් නොමැති බවත් එම වේදනාව දරාගත හැකි බවත් ප්‍රකාශ කළ බැවින් එසේ ප්‍රමාද වූ බව සඳහන් කර ඇත. වින්දිතයා රෝහල්ගත වූ පසු තමා ඔහුව මුණගැසුණු බවත්, එවිට යතුරුපැදි අනතුරක් හේතුවෙන් කෘත්‍රිමව සකස් කර තිබූ දත් ගැලවී ගිය බැවින් ඒ පිළිබඳව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට බලාපොරොත්තු නොවන බව වින්දිතයා පැවසූ බවත් ප්‍රකාශ කර ඇත. මෙම සිදුවීම පිළිබඳව "විශේෂ සිදුවීම් සම්බන්ධ ලේඛනයේ" සටහන් තබා ඇති බවත්, මධුෂාන් නැමැත්තා දෛනික නියෝගවලින් ඉවත් කළේ මින් ඉදිරියට මෙවැනි සිදුවීම් වළක්වා ගැනීමට බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත. සිද්ධිය වූ

දින ශෝධනාගාරයේ අණභාර නිලධාරියා ලෙස කමාන්ඩර් මුණිදාස මහතා කටයුතු කළ බව ද වගඋත්තරකරු සඳහන් කර ඇත. අවසාන වශයෙන්, බර වැඩ හෝ දඬුවම් සරඹ කිරීමේදී මෙවැනි දෙයක් සිදුවීම සාමාන්‍ය නොවන බවත්, යම්කිසි අයෙකු වින්දිතයාට පහරදීමක් සිදු කළේ නම් ඔහුගේ තොල් පවා තුවාල විය හැකි බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>වෛද්‍ය වාර්තා</u>

### 01. අධිකරණ වෛද්‍ය වාර්තාව

වින්දිතයා 2024.08.12 වන දින කොළඹ උතුර (රාගම) ශික්ෂණ රෝහල වෙත ඇතුළත්ව අධිකරණ වෛද්‍ය නිලධාරියා වෙත ඉදිරිපත් වී ඇති අතර, එහිදී ලබා දී ඇති රෝග ඉතිහාසයට අනුව 2024 ජූලි මස 20, 21 සහ 22 යන දිනයන්හිදී වැලිසර ගැමුණු නාවික හමුදා කඳවුර තුළදී මෙම පහරදීම සිදුවී ඇති බවයි. තව ද ඕ.ඩී. මධුෂාන් විසින් ලී පොල්ලකින් තම තට්ටම් ප්‍රදේශයට සහ උදරයේ පිටුපස ප්‍රදේශයට පහර දුන් බවත්, මිට මොළවා සහ අතුල් පහරින් මුහුණට පහර දුන් බවත් වින්දිතයා ප්‍රකාශ කර ඇති අතර, මධුෂාන්ගේ අණ කිරීම මත ඕ.ඩී. සේනාධීර විසින් ද ලී පොල්ලකින් තම තට්ටම් ප්‍රදේශයට පහර දුන් බව සඳහන් කර ඇත. ඒ අනුව අධිකරණ වෛද්‍ය පරීක්ෂණයේදී නිරීක්ෂණය වූ තුවාල ලෙස, ඉහළ හනුවේ මැද කෘන්තක දත් (Central Incisors) දෙකම අස්ථානගත වී (Missing) ඇති බවත්, ඉහළ හනුවේ දකුණු පස පාර්ශ්වික කෘන්තක දත (Lateral Incisor) කැඩී යාමකට ලක්ව ඇති බවත් සඳහන් කර ඇත.

අධිකරණ වෛද්‍යවරයා විසින් මෙම තුවාල බරපතල තුවාල (Grievous injuries) ලෙස නිර්ණය කර ඇති අතර, දණ්ඩ නීති සංග්‍රහයේ 311 වගන්තිය ප්‍රකාරව දත් දෙකක් කැඩී යාම සහ දත් දෙකක් නොමැතිවීම යන විස්තරාත්මක සටහන් සහිතව 'ජී' (G) කාණ්ඩය යටතේ එය වර්ගීකරණය කර ඇත. තවද, අදාළ තුවාල මොට බල පහරක් (Blunt force impact) මගින් සිදුවිය හැකි බවත්, ප්‍රකාශිත සිද්ධිය වූ කාල වකවානුව හා තුවාලවල ස්වභාවය එකිනෙක සැසඳෙන බවත් (Consistent with the time of infliction) වෛද්‍ය මතය ලෙස සඳහන් කර ඇත.

### 02. නාවික හමුදා වෛද්‍ය වාර්තාව

කොමිෂන් සභාව විසින් කරන ලද දැනුම්දීමට අනුව, NHQ/HS/MCRR/DI/17/2025 හා 2025.03.14 දිනැති ලිපිය මගින් නියෝජ්‍ය අධ්‍යක්ෂ නාවික සෞඛ්‍ය සේවා (P&R) විසින් වෛද්‍ය සටහන් හා ලේඛණයන්හි පිටපත් රහිතව වින්දිතගේ වෛද්‍ය වාර්තාවක් ඉදිරිපත් කර ඇත. එහි අදාළ නාවිකයා 2024 ජූලි මස 19 වන දින නාවික රැඳවුම් මැදිරිය (Naval Dungeon) වෙත ඇතුළත් කිරීමට ප්‍රථම වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර ඇති බව සඳහන් කර ඇත. වැඩිදුරටත් කරුණු දක්වමින්, වින්දිතට දින වකවානු නිශ්චිත නොමැති පැරණි වම් උරහිසේ හන්දි පැනීමක් (Left sided shoulder dislocation) සහ ඊට අදාළව පවතින වේදනාවක් පිළිබඳ ඉතිහාසයක් ඇති බවත්, ඔහුගේ ද්විපාර්ශ්වික කර්ණ පටහ පටල (Bi-lateral tympanic membranes) නිරුපද්‍රිතව පැවති අතර, වෙනත් කිසිදු තුවාලයක් හෝ ආබාධයක් එම අවස්ථාවේදී සටහන් වී නොමැති බව සඳහන් කර ඇත.

පසුව 2024 ජූලි මස 22 වන දින රැඳවුම් මැදිරිය තුළ සිටියදී, විනය පාලක නාවිකයෙකු විසින් ලී පොල්ලකින්, මිට මොළවා අතින් ඔහුගේ මුහුණට සහ කොන්දට පහර දුන් බව සඳහන් කර ඇති බැවින් වින්දිතට රෝගී වාර්තාවක් ලබා දී ඇත. එම අවස්ථාවේදී ඔහුට වම් ඇසෙහි වේදනාවක්, වම් පස හිස රිදීමක්, කොන්දේ වේදනාව සහ එදින උදෑසන එක් වරක් වමනය යාමේ තත්ත්වයක් පැවතුණ බව

සඳහන් කර ඇත. වෛද්‍ය පරීක්ෂාවේදී, ඔහුගේ ඉහළ කෘන්තක දත්වල දන්ත පාලම් අස්ථානගත වී තිබූ අතර, ඉහළ වම් දෙවන කෘන්තක දත කැඩීයාමකට සහ ඉහළ දත් ඇන්දේ විදුරුමස් වලින් ලේ ගැලීමකට ලක්ව තිබී ඇති බව සඳහන් කර ඇත. තවද, තට්ටම් ප්‍රදේශයේ තැලීම් සලකුණක් නිරීක්ෂණය වූ බවත් ඔහුගේ කර්ණ පටහ පටල සාමාන්‍ය තත්ත්වයේ පැවති බවයි. වින්දිතට වේදනා නාශක ඖෂධ ලබා දී සැහැල්ලු රාජකාරි කාණ්ඩයට යොමු කර ඇති බවත් සඳහන් කර ඇත.

*[Sailor has sick reported on 22nd July 2024 while in Dungeon complaining of assault by a provost sailor with a wooden bar, fist hand and hit on face and back. He had left sided eye pain, left sided headache, back ache and vomited once in morning. He had dislodged and missing bridges of both upper incisors, fractured upper left second incisor, gingival bleeding at upper incisor, contusion mark over buttocks, and his bi-lateral tympanic membranes were normal. He was treated with pain controls and placed light duty category]*

ඉන් අනතුරුව 2024 අගෝස්තු මස 02 වන දින නාවික රැඳවුම් මැදිරියෙන් මුදා හැරීමට පෙර මොහු නැවත වෛද්‍ය පරීක්ෂණයකට ලක් කළ බවත්, එහිදී සුව වෙමින් පවතින විදුරුමස් තුවාල හැර වෙනත් තුවාල හෝ ආබාධ හමුවී නොමැත. බිඳුණු දත් සඳහා වින්දිත දන්ත සායනය මගින් වැඩිදුර ප්‍රතිකාර ලබමින් සිටි බවත්, අනතුරුව 2024 අගෝස්තු මස 28 වන දින සිට ඔහු වම් පාදයේ පහළ කොටසේ වේදනාවක් පිළිබඳව පැමිණිලි කළ අතර, එය වම් පස සයටිකා (Left sided Sciatica) තත්ත්වය ලෙස හඳුනාගෙන, නාවික රෝහල සහ ගාල්ල නාවික රෝහලේ අස්ථි සායනය මගින් ඊට අදාළ ප්‍රතිකාර සිදු කරන ලද බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

<u>නිරීක්ෂණ -</u>

1. වින්දිත නාවිකයා නාවික හමුදාවේ නායක නැවි නිලයේ රාජකාරි කරනු ලබන අයෙකු වන අතර, කල්පිටිය නාවික හමුදා කඳවුරේ සිදුවීමකට අදාළව නියම වූ දින 14 ක දඩුවම් කාලයක් ගෙවීම සඳහා 2024.07.19 වන දින වැලිසර නාවික හමුදා චරිත ශෝධනාගාරය වෙත යොමු කර ඇත. වින්දිතයා සහ පැමිණිලිකාරිය විසින් ලබා දෙන ලද ප්‍රකාශයන්ට අනුව, වින්දිත රැඳවුම් භාරයට පත් කිරීමේ ක්‍රියාවලිය පවුලේ සාමාජිකයන්ගෙන් වසන් කර තබා ගැනීමට වින්දිතයා උත්සාහ කර ඇති බවත්, ඒ අනුව මෙම සිදුවීම සම්බන්ධයෙන් සිය නිවැසියන් දැනුවත් කිරීම සිදු නොකරන ලෙසට නිලධාරීන්ගෙන් ඔහු ඉල්ලීම් කර ඇත. මෙම සිදුවීමෙන් අනතුරුව වින්දිතයා වෙත ලබා ගන්නා ලද වීඩියෝ දූරකථන ඇමතුමක් (Video Call) අතරතුරදී, වින්දිතයාගේ ඉහළ හනුවේ ඉදිරිපස දත් දෙකක් අහිමි වී ඇති බව පැමිණිලිකාර බිරිඳ විසින් නිරීක්ෂණය කර ඇත. මෙම අනාවරණයෙන් අනතුරුව, වින්දිතයාට නාවික හමුදා භාරයේදී සිදු වූ බව කියන අගතිය සහ වධහිංසනය සම්බන්ධයෙන් පැමිණිලිකාරිය අධිකරණ ක්‍රියාවලියට යොමු වීමටත්, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත මෙම පැමිණිල්ල ඉදිරිපත් කිරීමටත් පියවර ගෙන ඇති බව නිරීක්ෂණය වේ.

2. චරිත ශෝධනාගාරය වෙත ඇතුළත් කිරීමට ප්‍රථම වින්දිතයා නාවික හමුදා රෝහල වෙත යොමු කර වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කර ඇති බව සනාථ කිරීම සඳහා පැමිණිලිකරු, නාවික හමුදා මූලික රෝහලේ බාහිර රෝගී ප්‍රතිකාර පත්‍රිකාවේ පිටපත මානව හිමිකම් කොමිෂන් සභාවට ඉදිරිපත් කර ඇත. අදාළ ලේඛනයට අනුව, 2024.07.19 දින පැය 17:36ට වගඋත්තරකාර එස්.ආර්.එම්. මධුෂාන් (එක්ස්ආර්117656) විසින් වින්දිත පී.ඒ.අයි.කේ. කුමාරව රෝහල වෙත ඉදිරිපත් කර ඇති බවත්, වෛද්‍ය පරීක්ෂණය සිදු කිරීමට අකමැත්තක් නොමැති බවට වින්දිතයා විසින් එහි අත්සන් තබා ඇත. ඒ අනුව රැඳවුම් මැදිරියට ඇතුළත් කිරීමට පෙර ඔහු මනා සෞඛ්‍ය තත්ත්වයෙන් පසුවී ඇති අතර ඔහුගේ දත් හෝ කශේරුකාව ආශ්‍රිත කිසිදු ආබාධයක් එම අවස්ථාවේදී වාර්තා කර නොමැත.

3. නාවික හමුදා චරිත ශෝධනාගාරයේ දෛනික නියෝග ලේඛනය පරීක්ෂා කිරීමේදී, 2024 ජූලි 21 වන දින පැය 16.00-20.00 සහ පැය 04.00-08.00 කාලසීමාවන් තුළ සානැවි (විපා) එස්.ආර්.එම්. මධුශාන් (එක්ස්ආර් 117656) 'ඒ' සහ 'බී' රැඳවුම් රාජකාරිවල නිරතව සිට ඇත. එසේ වුවද, 2024 ජූලි 22 වන දින පැය 20.00 සිට 00.01 දක්වා වූ රැඳවුම් රාජකාරි ලේඛනයෙහි ඔහුගේ නම තනි ඉරකින් කපා ඉවත් කර ඇත. තවද, යතුරුලියනය කරන ලද එම දෛනික නියෝග ලේඛනයෙහි අත් අකුරින් තබන ලද සටහනක් මගින්, 2024.08.22 වන දින පෙරවරු 10.00 සිට කොළඹ නාවික මහා රෝහලේ රෝහල් රාජකාරි සඳහා නාවිකයන් අනියුක්ත කර ඇති බව නිරීක්ෂණය වේ.

ඉහත කරුණු අනුව, වින්දිතයා 2024.07.19 වන දින චරිත ශෝධනාගාරය වෙත ඇතුළත් කිරීමෙන් පසු, 2024.07.21 වන දින වගඋත්තරකරු විසින් සිදු කරන ලදැයි කියන පහරදීම සම්බන්ධව පැමිණිල්ලේ සඳහන් කරුණු සහ ලේඛනගත දත්තය සමපාත වන බව නිරීක්ෂණය වේ.

මෙම පහරදීම හේතුවෙන් සිදු වූ බරපතල තුවාල සඳහා ප්‍රතිකාර ලබාදීම පිණිස 2024.07.22 වන දින පෙරවරු 10.00 ට වින්දිතයාව රෝහල වෙත යොමු කිරීමට පියවර ගෙන ඇත. එතෙක් දෛනික රාජකාරි නියෝගවල (Daily Orders) සඳහන්ව නොතිබූ 'රෝහල් රාජකාරි' සටහනක් අත්අකුරින් හදිසියේ ඇතුළත් කර තිබීමත්, එදින පැය 20.00 සිට 00.01 දක්වා වූ රාජකාරි කාලසීමාවෙන් පළමු වන වගඋත්තරකරු ඉවත් කර තිබීමත් මගින් මෙම සිදුවීම තර්කානුකූලව ගැලපේ.

තවද, නාවික හමුදා නියෝජ්‍ය අධ්‍යක්ෂ (නාවික සෞඛ්‍ය සේවා) විසින් ඉදිරිපත් කර ඇති වෛද්‍ය වාර්තාවේ, විනය පාලක නාවිකයෙකු (Provost) විසින් ලී පොල්ලකින් සහ මිට මොළවන ලද අතින් වින්දිතයාගේ මුහුණට සහ කොන්දට පහර දුන් බවට වූ ප්‍රකාශය පැහැදිලිව සටහන් කර ඇත. එම ප්‍රකාශය මත පදනම්ව වින්දිතයා වෙත වෛද්‍ය වාර්තාවක් නිකුත් කර තිබීම තුළින් 2024.07.22 වන දින උදෑසන අදාළ පහරදීම සිදුව ඇති බවත්, එය වධහිංසාකාරී ස්වභාවයක් ගෙන ඇති බවත් නිරීක්ෂණය වේ.

4. තවද, වින්දිත නායක නැවි පී.ඒ.අයි.කේ. කුමාර (එක්ස්.එස් 87574) 2024.07.22 වන දින නාවික හමුදා මූලික රෝහල වෙත ඇතුළත් කර 2024.07.25 වන දින දක්වා නේවාසිකව ප්‍රතිකාර ලබා දී ඇති බව ඉදිරිපත් කර ඇති වෛද්‍ය සටහන් පිටපත් පරීක්ෂාවේදී නිරීක්ෂණය වේ. එම රෝගී වාර්තාවල රෝග විනිශ්චය සහ ඉතිහාසය යටතේ, *"දන්නා පුද්ගලයෙකු විසින් 2024.07.22 දින පෙ.ව. 06.30 ට එන්.ඩී.සී (NDC) හිදී පහරදීමක් සිදු කර ඇති බවත්, මුහුණේ වම් පසට එල්ල වූ එම පහරදීම හේතුවෙන් දත් දෙකක් අහිමිව ගොස් ඇති බව"* ද සටහන් තබා ඇත.

5. මහබාගේ පොලිසිය විසින් 2024.08.12 වන දින වින්දිතයාව රාගම, උතුරු කොළඹ ශික්ෂණ රෝහලේ අධිකරණ වෛද්‍යවරයා වෙත ඉදිරිපත් කර ඇති අතර, එහිදී රෝගියා විසින් ලබා දී ඇති රෝග ඉතිහාසය වෛද්‍ය වාර්තාවේ පහත පරිදි සටහන්ව ඇත.

*"ඕ.ඩී. මධුෂාන් විසින් ලී පොල්ලකින් තට්ටම් ප්‍රදේශයට සහ උදරයේ පිටුපසට පහර දී ඇත. මිට මොළවා සහ අතුල් පහරින් මුහුණට පහර දුන්නේය. පසුව ඔහු (ඕ.ඩී. මධුෂාන්) විසින් ඕ.ඩී. සේනාධීරට පහර දෙන ලෙස අණ කරන ලදී. ඒ අනුව ඕ.ඩී. සේනාධීර විසින් ලී පොල්ලකින් තට්ටම් ප්‍රදේශයට පහර දී ඇත. මෙම සිදුවීම 2024 ජූලි මස 20, 21 සහ 22 යන දිනවල ගැමුණු නාවික හමුදා කඳවුර තුළදී සිදුවිය."*

6. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව වින්දිතයාගේ උඩු හනුවේ මැද කෘන්තක දත් දෙක නොමැති අතර උඩු හනුවේ දකුණු පාර්ශ්වික කෘන්තක දත කැඩීයාමකට ලක්ව ඇත (Missing upper jaw both central incisor teeth and broken upper jaw right lateral incisor teeth). මෙම දත් අහිමි වීම සහ කැඩී

යාම 'බරපතල තුවාල' (Grievous injuries) ගනයට අයත් වන බව වෛද්‍ය වාර්තාවේ පැහැදිලිව සටහන් කර ඇත. එසේම, මෙම තුවාල රටාව මොට බල පහරක් (Blunt force impact) එල්ල කිරීමෙන් සිදුවිය හැකි බවත්, පහරදීම සිදුවූ බව කියන කාල වකවානුව හා තුවාලවල ස්වභාවය එකිනෙක සැසඳෙන බවත් (Consistent with the time of infliction) අධිකරණ වෛද්‍ය නිගමනය මගින් තහවුරු කර ඇත.

*7.* අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුව, මොට බලය යෙදීමෙන් වින්දිතයාගේ උඩු හනුවේ මැද කෘන්තක දත් දෙක අහිමි වී ඇති අතර, උඩු හනුවේ දකුණු පාර්ශ්වික කෘන්තක දත කැඩීයාමෙන් බරපතල තුවාල සිදුව ඇති බව ඉතා පැහැදිලිව සඳහන් කර ඇත. එසේ වුවද, නාවික හමුදා වෛද්‍ය වාර්තාව මගින් වින්දිතයාගේ ඉහළ කෘන්තක දත්වල දන්ත පාලම් (Bridges) අස්ථානගත වී ඇති බවත්, ඉහළ වම් දෙවන කෘන්තක දත කැඩීයාමකට ලක්ව ඇති බවත්, විදුරුමස්වලින් රුධිරය වහනය වී ඇති බවත් දක්වා ඇත.

වින්දිතයාගේ ප්‍රකාශයට අනුව, තමා සතුව තිබුණේ කෘත්‍රිම දත් බවට පිළිගන්නා ලෙස බලපෑම් කර, නාවික හමුදා චරිත ශෝධනාගාරයේදී ඔහුගෙන් බලහත්කාරයෙන් ලිඛිත ප්‍රකාශයක් ලබාගෙන ඇත. ඒ හරහා මෙම පහරදීමේ බරපතලකම යටපත් කිරීමට නාවික හමුදාව උත්සාහ දරා ඇති බව වින්දිතයා චෝදනා කරයි. ඒ අනුව නිරීක්ෂණය වන්නේ, අධිකරණ වෛද්‍යවරයාගේ වෛද්‍ය මතයට වෙනස් වන පරිදි, වින්දිතයා සතුව කෘත්‍රිම දන්ත පාලම් තිබූ බව පවසමින් නාවික හමුදා වෛද්‍ය වාර්තාව මගින් මෙම බරපතල පහරදීමේ ස්වභාවය අවතක්සේරු කිරීමට හෝ වසන් කිරීමට උත්සාහ කර ඇති බවයි.

*8.* 2025.01.21 වන දින වින්දිතයා බූස්ස නාවික කඳවුරේ රාජකාරියේ නිරතව සිටියදී ඔහුගේ වම් පාදයේ ඇති වූ හදිසි අප්‍රාණිකත්වයක් හේතුවෙන් නාවික හමුදා රෝහල වෙත ඇතුළත් කර අනතුරුව, වැඩිදුර පරීක්ෂණ හා ප්‍රතිකාර සඳහා 2025.01.22 වන දින ඔහු කරාපිටිය ශික්ෂණ රෝහල වෙත යොමු කර ඇත. මෙම කරුණු සනාථ කිරීම සඳහා බූස්ස කඳවුර මගින් නිකුත් කරන ලද රෝගීන් යොමු කිරීමේ ලේඛන සහ කරාපිටිය ශික්ෂණ රෝහලේ ප්‍රතිකාර සටහන්වල පිටපත් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇත. එමෙන්ම, වින්දිතයා 'සයටිකා' (Sciatica) රෝගී තත්ත්වය සඳහා ප්‍රතිකාර ලබන බව සනාථ කෙරෙන අදාළ සායනික සටහන් ඇතුළු වෛද්‍ය වාර්තා ද සාක්ෂි වශයෙන් ඉදිරිපත් කර ඇත.

*9.* මෙම සිද්ධිය සම්බන්ධයෙන් මහබාගේ පොලිසිය විසින් 2024.08.26 වන දින වත්තල මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක බී 3598/2023 යටතේ නඩුවක් ගොනු කර ඇත. අදාළ නඩුව සමථ මණ්ඩලය වෙත යොමු කළද, 2024.12.07 දින පැවති සමථ මණ්ඩල රැස්වීමේදී පාර්ශවයන් සමථයකට පත් නොවූ බව අධිකරණයට වාර්තා වීම හේතුවෙන් නඩුව කල් තබා ඇත. මේ අතර, නාවික හමුදාව පළමු වගඋත්තරකරුට එරෙහිව අපරාධමය චෝදනාවක් යටතේ නඩුවක් විභාග වන බැවින්, මානව හිමිකම් කොමිෂන් සභාවේ පවතින පැමිණිල්ල විභාග නොකර නිෂ්ප්‍රභ කළ යුතු බව අවස්ථා කිහිපයක දී ලිඛිතව සහ වාචිකව සඳහන් කර ඇත.

.10. නාවික හමුදාවේ සේවයේ නියුතු අනෙකුත් නාවිකයන් පළිගැනීම්වලට ලක්වීමේ බිය හේතුවෙන් දිවුරුම් ප්‍රකාශ ලබා දීමට අකමැත්ත පළ කර ඇති බැවින්, මහබාගේ පොලිසිය වෙත ලබාදුන් ප්‍රකාශ සැලකිල්ලට ගන්නා ලෙස පැමිණිලිකාරිය ලිඛිතව කොමිෂන් සභාව වෙතින් ඉල්ලීම් කර ඇත.

- වින්දිතයා මහබාගේ පොලිසිය වෙත පහත ප්‍රකාශය ලබාදී ඇත.

*" බූස්ස නාවික හමුදා කඳවුරට අනුයුක්තව සේවයේ යෙදී සිටිය දී ඉන්ධන සම්බන්ධ විනය ගැටලුවක් හේතුවෙන් 2024.07.19 වන දින සිට දින 14ක දඬුවම් කාලසීමාවක් සඳහා වැලිසර නාවික චරිත ශෝධනාගාරය වෙත යොමු කර ඇති බවත්, 2024.07.20 සහ 21 යන දිනවල නිවාඩු පැවතියද, එහි*

විනය ආරක්ෂක සාමාන්‍ය නැවි එස්.ආර්.එම්. මධුෂාන් (XR 117656) විසින් ඔහුට පොලු වලින් කොන්දට සහ තට්ටම් ප්‍රදේශයට පහර දී ඇති බව සඳහන් කර ඇත. අනතුරුව 2024.07.22 වන දින පෙරවරු 06:00 ට පමණ, අදාළ මධුෂාන් නැමති අය දඬුවම් සඳහා පැමිණ සිටි තවත් නිලධාරියෙකු ලවා ද ඔහුට පොලු වලින් පහර දී තිබේ.

එදිනම, අනෙකුත් රැඳවියන් දඬුවම් ලබන ස්ථානයේ සිටියදී, මධුෂාන් විසින් ඔහු වෙනම කාමරයකට රැගෙන ගොස් ඔහුගේ වරද පවසමින් කෑගසන ලෙස අණ කර ඇත. එම අවස්ථාවේදී මධුෂාන් විසින් ඔහුගේ මුහුණට, කම්මුලට සහ හිසට වැරෙන් පහර දී ඇති අතර, මුහුණට එල්ල වූ ප්‍රබල පහරක් හේතුවෙන් ඔහුගේ දත් දෙකක් ගැලවී රුධිරය සමඟ අතට වැටී ඇත. පහරදීම හේතුවෙන් ඇති වූ අධික වේදනාව හමුවේ ඔහු සිහිසුන්ව ඇද වැටී ඇති අතර, පසුව දඬුවම් ලැබීම සඳහා පැමිණ සිටි ආධුනික නැවි සේනාධීර විසින් ඔහුට සහය වී රුධිරය පිරිසිදු කර නාවිකයින් රැඳී සිටින ස්ථානය වෙත රැගෙන ගොස් ඇත.

පසුව, ඕ.අයි.සී. සහ කොමාණ්ඩර් මුනිදාස යන නිලධාරීන්ගේ පරීක්ෂාවෙන් අනතුරුව, ඔහුව වැලිසර නාවික මහා රෝහල (NGH) වෙත යොමු කර තිබේ. එහි දින 04 ක් නේවාසිකව ප්‍රතිකාර ලබා ඇති බවත්, නාවික හමුදා කඳවුරෙන් එල්ල වූ බලපෑම මත අධිකරණ වෛද්‍ය කටයුතු අවශ්‍ය නොවන බවට වෛද්‍යවරයාට දැනුවත් කළ බවත්, මෙම පහරදීම සම්බන්ධයෙන් මෙතෙක් කිසිදු සාධාරණයක් ඉටු වී නොමැති බවත්, පහරදීමේ වේදනාවෙන් පසුවන බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත."

- මෙම සිදුවීම ඇසින් දුටු සාක්ෂිකරුවෙකු ලෙස එල්.එම් සේනාධීර මහබාගේ පොලීසිය වෙත පහත ප්‍රකාශය ලබා දී ඇත.

"ඔහු 2024.06.18 දින සිට දින 45ක දඬුවම් කාලසීමාවක් සඳහා වැලිසර නාවික හමුදා කඳවුරේ රඳවා සිට ඇති අතර, ඔහු එහි පැමිණ මාසයක් පමණ ගත වූ පසු මෙම සිදුවීම සිදුව ඇති බවයි. එහි සිටිය දී දඬුවම් ලැබීමට තවත් නාවිකයන් තිදෙනකු පැමිණි බවත් ඒ අතර වින්දිත නායක නැවි කුමාර සිටි බවත්, ඔහු තනි සිරමැදිරියක දමා සිටි බවත් දිනය අමතක එක්තරා සඳුදා දිනක පෙරවරු 06.00ට පමණ දඬුවම් කරන ස්ථානයට ඔහු ඇතුළු තිදෙනකු රැගෙන ආ බවත්, මෙම දඬුවම් අතරතුර දී කාර්ය මණ්ඩලයේ මධුෂාන් නැමති අය විසින් නායක නැවි කුමාරව වෙන්වූ කාමරයක් වැනි ස්ථානයකට රැගෙන ගොස් ඇති අතර, මිනිත්තු 05 කට පමණ පසු කුමාර එම ස්ථානයේ බිම වැටී සිටින බවට දැනගැනීමෙන් එම ස්ථානයට යන විට නායක නැවි කුමාර බිම වැටී සිටි බව දැක ඇත.

අනතුරුව, ඔහු සහ තවත් අයෙකු විසින් කුමාරව ඔසවාගෙන ගොස් ඇඳක තබා ඇති අතර, උසස් නිලධාරීන් දැනුවත් කිරීමෙන් පසු පෙරවරු 09.30 ට පමණ ඔහුව රෝහල්ගත කර තිබේ. රෝහල් ප්‍රතිකාරවලින් පසු ඔහුව නැවත චරිත ශෝධනාගාර සිර මැදිරියට රැගෙන විත් ඇති අතර, දින 14ක දඬුවම් කාලසීමාව අවසානයේ කුමාර කඳවුරේ රෝගී මැදිරියේ (Sick Room) ප්‍රතිකාර ලබමින් සිටි බවත් ඔහු විසින් ලබාදී ඇති ප්‍රකාශයේ වැඩිදුරටත් සඳහන් කර ඇත."

11. කොමිෂන් සභාව හමුවේ පළමු වන වගඋත්තරකරු මුලින් පිළිගෙන ඇත්තේ තමා වින්දිතයාට පහර දුන් බවත්, එය කිසිවෙකුගේ පෙළඹවීමකින් තොරව සිදු කළ බවත්ය. කෙසේ වෙතත්, 2025.02.21 දින විමර්ශනය අතරතුර නාවික හමුදාව නියෝජනය කළ ලුතිනන් කමාන්ඩර් ඩබ්.ජී. රොද්‍රිගෝ මහතා විසින් නීතිඥවරයෙකු ලෙස පෙනී සිටිමින්, වගඋත්තරකරුට පෞද්ගලිකව උපදෙස් ලබා දීමට අවශ්‍ය බව පවසා විමර්ශන ක්‍රියාවලියට බාධා කරමින් ඔහුව පිටතට රැගෙන ගොස් සාකච්ඡා කර ඇත. අනතුරුව, වගඋත්තරකරු ලවා පෙර ලබා දුන් ප්‍රකාශ වෙනස් කිරීමට සහ තමාට අවාසිදායක කරුණු ඉවත් කර ගැනීමට බලපෑම් කර ඇති බව නිරීක්ෂණය වේ. මෙය කොමිෂන් සභාවේ විමර්ශන කටයුතු සඳහා සිදුකල බාධාවක් ලෙස සලකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිතුමා හා

කොමසාරිස්තුමා ඇතුළු නිලධාරී මණ්ඩලයක් විසින් අධ්‍යක්ෂ නාවික නීති සේවා සහ ලුතිනන් කමාන්ඩර් ඩබ්.ජී. රොද්‍රිගෝ කොමිෂන් සභාව වෙත කැඳවීම් කර ඇත. එම අවස්ථාවේ දී තම නොදැනුවත්භාවය මත සිදුවන ලද හැසිරීම සම්බන්ධයෙන් ඩබ්.ජී රොද්‍රිගෝ ලිඛිතව සිදුකරන ලද සමාව ඉල්ලීම කොමිෂන් සභාව පිළිගෙන ඔහුට අවවාද කර ඉදිරියට මෙවැනි සිදුවීම් නොවීමට වගබලා ගන්නා ලෙස දන්වා, එකී වගකීම සම්බන්ධව තවදුරටත් පියවර නොගැනීමට තීරණය කර ඇත.

12. නාවික හමුදාව විසින් නාවික හමුදා පනත සහ අදාළ ගැසට් නිවේදන උපුටා දක්වමින්, දණ්ඩනයට ලක් වූ නාවිකයන් ලවා 'බර වැඩ/ දඬුවම් සරඹ' කරවීමට පවතින ව්‍යවස්ථාපිත බලතල මඟින් මෙම ක්‍රියාව සාධාරණීකරණය කිරීමට ප්‍රයත්නයක නිරත වුවද, අධිකරණ වෛද්‍ය වාර්තාව ඇතුළු සාක්ෂි මඟින් අනාවරණය වන්නේ මෙය හුදෙක් 'දඬුවම් සරඹයක්' නොව, අත් සහ ලී මුගුරු භාවිතයෙන් සිදු කරන ලද වධහිංසාවක් බවයි. පහරදීමට යොදාගත් ලී මුගුරු පවා බිඳී යන තෙක් අමානුෂික අයුරින් පහර දුන් බවට පැමිණිලිකරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු, වින්දිතයාගේ තට්ටම් ප්‍රදේශයෙහි පවතින තැලීම් සලකුණු සම්බන්ධයෙන් නාවික හමුදා වෛද්‍ය වාර්තාවේ සඳහන් සටහන මඟින් ද තවදුරටත් තහවුරු වේ. ඒ අනුව, මෙම ක්‍රියාව නීත්‍යානුකූල දඬුවම් සරඹ පැමිණවීමේ සීමාවන් ඉක්මවා ගිය වධහිංසාවක් බව නිරීක්ෂණය වේ.

13. 1991 නාවික හමුදා රැඳවුම් නියෝග ප්‍රකාරව, රැඳවුම් බැරැක්ක පවත්වාගෙන යාම සහ එහි රඳවා සිටින පුද්ගලයන්ගේ ආරක්ෂාව, සෞඛ්‍යය හා විනය තහවුරු කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් ව්‍යවස්ථාපිත රෙගුලාසි පනවා ඇත.

- 03 වන නියෝගය: ස්ථාපිත රැඳවුම් බැරැක්කවල සමස්ත පාලනය, අදාළ ආයතනයේ හෝ කඳවුරේ අණදෙන නිලධාරියා සතු විය යුතුය.

- 04(ආ) වන නියෝගය: සෑම රැඳවුම් බැරැක්කයක්ම ප්‍රමාණවත් වාතාශ්‍රය සහිතව සහ එහි රඳවා සිටින පුද්ගලයන්ගේ සෞඛ්‍යය හා ආරක්ෂාව තහවුරු වන පරිදි සකස් කළ යුතුය. තවද, කාර්යභාර නිලධාරියාගේ අවධානය සෑම රැඳවියෙකු වෙතම නිරන්තරයෙන් යොමු විය හැකි පරිදි ප්‍රමාණවත් පහසුකම් පැවතිය යුතුය.

- 32 සහ 35 වන නියෝග: රැඳවුම් බැරැක්ක භාර නිලධාරියා විසින් දණ්ඩනයට ලක්ව සිටින පුද්ගලයන්ගේ පෙරෙට්ටු සහ 'බර වැඩ' නිසි අයුරින් ක්‍රියාත්මක වන බවට වගබලා ගත යුතු අතර, ඒ සම්බන්ධ සියලු ලේඛන සහ පොත්පත් විධිමත්ව නඩත්තු කළ යුතුය.

- 33 වන නියෝගය: මුර පාලක අණදෙන නිලධාරියා සිය රාජකාරි කාලසීමාව තුළ රැඳවියන්ගේ පූර්ණ සුරක්ෂිතභාවය සම්බන්ධයෙන් වගකීමට බැඳී සිටිය යුතුය.
- 34 වන නියෝගය: විනය නිලධාරියා විසින් සෑම පැය 24කට වරක්ම රැඳවුම් බැරැක්ක පරීක්ෂා කර, දණ්ඩනයට ලක්ව සිටින එක් එක් පුද්ගලයාගේ තත්ත්වය නිරීක්ෂණය කළ යුතු බව අවධාරණය කර ඇත.

- 36 වන නියෝගය: රැඳවුම් බැරැක්ක භාර නිලධාරියා විසින් රැඳවියන්ගේ සෞඛ්‍ය හා විනය තත්ත්වය, වෛද්‍ය හා විනය නිලධාරීන්ගේ පැමිණීම සහ අනෙකුත් වැදගත් තොරතුරු 'රැඳවුම් ජර්නලයේ' නිවැරදිව සටහන් කිරීම අත්‍යවශ්‍ය වේ.

- 37 වන නියෝගය: දණ්ඩනයට ලක්වන පුද්ගලයෙකුට දඬුවම් නියම කරන සෑම නිලධාරියෙකුම, අදාළ වරද සහ ලබාදුන් දඬුවම පිළිබඳ විස්තර පොතෙහි ඇතුළත් කර තම අත්සනින් සහතික කළ යුතුය.

14. 1991 නාවික හමුදා රැඳවුම් නියෝග අංක 37 ප්‍රකාරව, දණ්ඩනයට ලක්වන පුද්ගලයෙකුට දඬුවම් පමුණුවනු ලබන සෑම නිලධාරියෙකුම, අදාළ වරද සහ ලබා දුන් දඬුවම පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු දඬුවම් පොතෙහි ඇතුළත් කර තම අත්සනින් සහතික කළ යුතු බවට ව්‍යවස්ථාපිත රෙගුලාසි පනවා ඇත. එසේ වුව ද, නාවික චරිත ශෝධනාගාරයේ පවත්වාගෙන යනු ලබන දඬුවම් පොතට අදාළ මුල් පිටපතට අදාළ සහතික කරන ලද ඡායා පිටපත් පිරික්සීමේදී නිරීක්ෂණය වන්නේ, එහි හුදෙක් වරදෙහි ස්වභාවය, නියම කළ දඬුවම, දඬුවම් ආරම්භ කළ දිනය සහ දඬුවමින් මුදාහරින දිනය වැනි මූලික තොරතුරු පමණක් ඇතුළත් කර ඇති බවයි.

මෙම විමර්ශනයේදී ඉදිරිපත් වූ සාක්ෂි සහ සාමාන්‍ය දින චර්යාවට කරුණු අනුව පෙනී යන්නේ, පැය 13.45-14.45 දක්වා කාලයේ දී 'දඬුවම් සරඹ' ක්‍රියාත්මක කරන මුවාවෙන් දවසේ ඕනෑම වෙලාවක් තුළ දී රැඳවියන් වෙත සරඹයන් සහ පහරදීම් සිදු කරන බවයි. එහෙත්, එකී දඬුවම් පමුණුවනු ලබන නිලධාරියා කවුරුන්ද යන්න හෝ එම සරඹවල ස්වභාවය පිළිබඳව කිසිදු සටහනක් හෝ වගකීම සහතික කෙරෙන අත්සනක් එම ලේඛනවල ඇතුළත් නොවන බව නිරීක්ෂණය වේ. මෙලෙස විධිමත් සටහන් තැබීම පැහැර හැරීම තුළින් දණ්ඩනයට ලක්වන පුද්ගලයන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමට ඇති හැකියාව සහ අදාළ නිලධාරීන්ගේ වගවීම ගිලිහී යන බව නිරීක්ෂණය වේ. ඒ අනුව, දඬුවම් වශයෙන් 'දඬුවම් සරඹ' පමුණුවන අවස්ථාවලදී පවා ඊට අදාළ වගකීම සහ විනිවිදභාවය සුරක්ෂිත වන පරිදි, නියමිත පටිපාටියට අනුකූලව නිවැරදි දඬුවම් ලේඛනයක් පවත්වාගෙන යාමට නාවික හමුදාව කටයුතු කළ යුතුය.

15. 1991 නාවික හමුදා රැඳවුම් නියෝග අංක 36 ප්‍රකාරව, රැඳවුම් බැරැක්ක භාර නිලධාරියා විසින් රැඳවියන්ගේ සෞඛ්‍ය හා විනය තත්ත්වය, වෛද්‍ය හා විනය නිලධාරීන්ගේ පැමිණීම සහ අනෙකුත් වැදගත් තොරතුරු 'රැඳවුම් ජර්නලයේ' නිවැරදිව සටහන් කිරීම ව්‍යවස්ථාපිත වගකීමක් වේ. එසේ වුවද, අදාළ රැඳවුම් ජර්නලයේ සහතික කරන ලද පිටපත් පිරික්සීමේදී නිරීක්ෂණය වන්නේ, 2024.07.19, 20, 23, 24, 25 සහ 26 යන දිනයන්හිදී *'රඳවා සිටින නාවිකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කිරීමට පැමිණි වෛද්‍ය නිලධාරී පරීක්ෂා කර කිසිදු රෝගී තත්ත්වයක් නොමැති බවට සටහන් තබන ලදී'* යනුවෙන් අතිශය ඒකාකාරී සහ යාන්ත්‍රික සටහන් පමණක් ඇතුළත් කර ඇති බවයි.

විශේෂයෙන්ම, මෙම බරපතල පහරදීමේ සිදුවීම වාර්තා වූ 2024.07.22 වන දින වෛද්‍යවරයෙකු පැමිණි බවට හෝ රැඳවියන් පරීක්ෂා කළ බවට කිසිදු සටහනක් ජර්නලයේ ඇතුළත් වී නොමැති වීම අවධානයට ලක් වේ. එමෙන්ම, මෙම පහරදීමෙන් පසුව වුව ද වින්දිතයාට සිදු වූ තුවාල හෝ ඔහුගේ සෞඛ්‍ය තත්ත්වයේ පිරිහීම පිළිබඳව කිසිදු සවිස්තරාත්මක තොරතුරක් එම නිල ලේඛනවල ඇතුළත් කිරීමට පියවර ගෙන නොමැති බව පෙනී යයි. නිල ලේඛන පවත්වාගෙන යාමේදී දක්නට ලැබෙන මෙම බරපතල නොසලකා හැරීම සහ පටිපාටිමය අසමත්භාවය තුළින්, රැඳවුම් භාරයේ සිටින පුද්ගලයන්ගේ ආරක්ෂාව සහ සෞඛ්‍ය තත්ත්වය පිළිබඳ විනිවිදභාවය සහ වගවීම නාවික හමුදාව විසින් පැහැර හැර ඇති බව නිරීක්ෂණය වේ.

16. නාවික චරිත ශෝධනාගාරයේ පවත්වාගෙන යනු ලබන විශේෂ සටහන් පොත් සහ ලොග් සටහන් (NAHA/PRO/GEN/02/07/2024 සහ 02/08/2024) පිරික්සීමේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය වේ'

2024 ජූලි 22 වන දිනට අදාළ සටහන්වල පැහැදිලිවම දක්වා ඇත්තේ, සානැවි (විපා) එස්.ආර්.එම්. මධුෂාන් විසින් වින්දිත රැඳවියාගෙන් ඔහු කළ වරද විමසා එය හඬනගා පවසන ලෙස නියෝග කළ

අවස්ථාවේදී, රැඳවියා කෙරෙහි ඇති වූ *"කලකිරීමක් මත"* වගඋත්තරකරු විසින් වින්දිතයා *"තමා අසලට ගෙන්වා කම්මුල වෙත පාරවල් කිහිපයක් එල්ල කළ බවයි."* මෙම සටහන මඟින් තහවුරු වන්නේ මෙය කිසිදු නීත්‍යානුකූල දඬුවම් සරඹයක කොටසක් නොව, වගඋත්තරකරුගේ පෞද්ගලික ආවේගය මත සිදුකළ සෘජු පහරදීමක් බවයි.

සටහන්වලට අනුව, මෙම පහරදීම සිදුවී ඇත්තේ පෙරවරු 07.00 ට පමණ වන අතර ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ අණභාර නිලධාරී පෙරවරු 08.00 වන විට ඒ පිළිබඳව දැනුවත් වී ඇත. එහෙත්, තුවාල ලැබූ රැඳවියා රෝහල්ගත කිරීම සඳහා ගිලන් රථපෝර්තු කර ඇත්තේ පෙරවරු 09.45 ටය. වින්දිතයාගේ දත් ගැලවී මුඛයෙන් රුධිරය වහනය වෙමින් පවතින බව නිලධාරීන් නිරීක්ෂණය කර තිබියදීත්, වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීමට පැය දෙකහමාරකට ආසන්න කාලයක් ප්‍රමාද කිරීම තුළින් රැඳවියන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳ පවතින නියෝග උල්ලංඝනය වී ඇති බව නිරීක්ෂණය වේ.

17. 2024 අගෝස්තු 24 වන දින පොලිස් විමර්ශනය හමුවේ වින්දිතයා ලබාදුන් ප්‍රකාශය නාවික හමුදා ලොග් සටහන්වල ද ඇතුළත් කර ඇත. එමඟින් අනාවරණය වන්නේ වින්දිතයා රෝහල්ගතව සිටියදී ඔහුට ආරක්ෂාවට යොදවා සිටි පී.ඕ. ගුණසිංහ සහ සානැවි සංකල්ප යන නිලධාරීන් හරහා අණභාර නිලධාරී (OIC) විසින් වින්දිතයාට දිගින් දිගටම තර්ජනය කර ඇති බවයි. විශේෂයෙන්ම, *"අධිකරණ වෛද්‍යවරයා ඉදිරියේ පහරදීමක් ගැන නොපවසන ලෙසත්, එසේ කළහොත් දඬුවම් කාලය අහෝසි කර නැවතත් දින 14 ක දඬුවමක් ක්‍රියාත්මක කරන බවටත්"* කළ තර්ජනයන් පිළිබඳව කරන ලද ප්‍රකාශයන් සම්බන්දයෙන් ද ලේඛනගත තොරතුරු පවතී. තවද, වැ/බ විනයාරක්ෂාධිපති විසින් රෝහල තුළදී වින්දිතයාට පරුෂ වචනයෙන් බැණ වැදී සිදුකළ තර්ජන සම්බන්දයෙන් කරන ලද ප්‍රකාශයන් ද මෙම සටහන් මඟින් සනාථ වේ.

නාවික හමුදා අභ්‍යන්තර සටහන්වල වින්දිතයාට අහිමි වූයේ "කෘත්‍රිම දත් දෙකක්" බව පමණක් හුවා දක්වමින් මෙම පහරදීමේ බරපතලකම අවතක්සේරු කිරීමට උත්සාහ කර ඇති බව පෙනී යයි. එහෙත්, පොලිස් විමර්ශනයේදී පහරදුන් අය පවසා ඇත්තේ ඉන් එක් දතක් ස්ථිර දතක් (Permanent tooth) වන බවයි. මෙලෙස දත් කෘත්‍රිම බව පවසන ලෙස වින්දිතයාට බලපෑම් කිරීම සහ ඒ පිළිබඳව බලහත්කාරයෙන් ප්‍රකාශ ලබා ගැනීම තුළින් වගඋත්තරකරුවන් සිය සාපරාධී වගකීමෙන් බැහැර වීමට උත්සාහ කර ඇති බව නිරීක්ෂණය වේ.

2024 අගෝස්තු 26 වන දිනට අදාළ විශේෂ සටහන් පොතේ අන්තර්ගතය අනුව, වගඋත්තරකාර සානැවි මධුෂාන් නිදහස් කර ගැනීම සඳහා නාවික හමුදාව සෘජුව මැදිහත් වී ඇත. අණභාර නිලධාරියාගේ උපදෙස් මත නාවික නිලධාරීන් ලවා නීතිඥ සහාය ලබා දීමට කටයුතු කිරීමත්, වගඋත්තරකරුට ඇප ලබා දීම සඳහා සානැවි සංකල්ප නමැති නිලධාරියාව "සිවිල් ඇඳුමින්" පොලිස් ස්ථානය වෙත ගෙන්වා ගෙන ඔහුව ඇපකරුවෙකු ලෙස ඉදිරිපත් කිරීමත් තුළින් පෙනී යන්නේ, නාවික හමුදාව වින්දිතයාට යුක්තිය ඉටු කිරීමට වඩා වරදකරු ආරක්ෂා කිරීමට පක්ෂපාතීව කටයුතු කර ඇති බවයි.

18. උක්ත පරිදි විශේෂ සටහන් තබා විනයාරක්ෂක නිලධාරී ලෙස කමාන්ඩර් මුණිදාස සහ විනයාරක්ෂක ජ්‍යෙෂ්ඨ නාවික ද අත්සන් කර ඇති නමුත්, වගඋත්තරකාර නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලද වාචික ප්‍රකාශයන් පිරික්සීමේදී, මෙම අමානුෂික පහරදීම වසන් කිරීමටත්, එහි සාපරාධී වගකීමෙන් බැහැර වීමටත් ඔවුන් උත්සාහය කර ඇති බව පෙනී යයි. තෙවන වගඋත්තරකාර කමාන්ඩර් මුණිදාස මහතා වින්දිතයා *"නාන කාමරය තුළ ඇද වැටුණු බව"* තමාට දැනුම් දුන් බව සඳහන් කර ඇත. එහෙත් හතරවන වගඋත්තරකාර එම්.ය.එස් කුමාර සහ පස්වන වගඋත්තරකාර පී.එම්.වීරසිංහ යන දෙදෙනාම සඳහන් කර ඇත්තේ, පළමුවන වගඋත්තර මධුෂාන් විසින් තමන් වෙත දන්වා සිටියේ *"උදෑසන ශරීර සුවතා කටයුතුවලින් (සරඹ) පසුව වින්දිතයාගේ දතක් රිදෙන බව"* හෝ දතක් ගැලවුණු බවයි. මේ අතර, සිද්ධිය ඇසින් දුටු දෙවන වගඋත්තරකාර සේනාධීර (රැඳවියෙකු ලෙස සිටි) පවසන්නේ

වින්දිතයාව විනය ආරක්ෂක නාවිකයා විසින් *"වෙනත් කාමරයකට රැගෙන ගිය බවත්, මිනිත්තු 05 කට පසු ඔහු එහි ලේ වහනය වෙමින් බිම වැටී සිටි බවත්"* ය. මෙම ප්‍රකාශයන් අතර පවතින අන්‍යෝන්‍ය පරස්පරතාවය මඟින් පෙනී යන්නේ, පහරදීම සිදු වූ සැබෑ ස්ථානය සහ ආකාරය වසන් කිරීම සඳහා එක් එක් නිලධාරියා විවිධ වූ හේතූන් පිළිබඳව ප්‍රකාශ කර ඇති බවයි.

පස්වන වගඋත්තරු ඔහු යන විට *"වින්දිතයාගේ මුඛයෙන් රුධිරය වහනය වන අයුරු තමා දුටු බව"* සහ ඔහු බිම දිගා වී සිටි බව ප්‍රකාශ කර ඇත. එහෙත් හතරවන වගඋත්තරු *"වින්දිතයා අතින් මුඛය වසාගෙන සිටි බැවින් රුධිරය වහනය වීමක් තමා නිරීක්ෂණය නොකළ බවයි."* එකම අවස්ථාවකදී, එකම ස්ථානයක සිටි නිලධාරීන් දෙදෙනෙකු වින්දිතයාගේ තුවාලයේ බරපතලකම සම්බන්ධයෙන් මෙලෙස පරස්පර තොරතුරු සැපයීම තුළින් ඔවුන්ගේ ප්‍රකාශයන්හි විශ්වසනීයත්වය බරපතල ලෙස බිඳ වැටේ.

තෙවන වගඋත්තර කමාන්ඩර් මුණිදාස සහ පස්වන වගඋත්තරකරු යන දෙදෙනාම උත්සාහ කරන්නේ වින්දිතයාට තිබුණේ "කෘත්‍රිම දත්" බවත්, ඒවා සරඹයකදී හෝ වැටීමකදී ඉබේ ගැලවී ගිය බවත්, මෙය වින්දිතයාට සිදු වූ බරපතල තුවාලය සාමාන්‍ය තුවාලයක් ලෙස හුවා දැක්වීමට දරන ලද පද්ධතිමය ප්‍රයත්නයකි. එහෙත් අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් මෙය මොට බලයක් යෙදීම නිසා සිදු වූ බරපතල හානියක් බව තහවුරු කර තිබීම තුළින් වගඋත්තරකරුවන්ගේ මෙම "කෘත්‍රිම දත්" පිළිබඳ තර්කය සම්පූර්ණයෙන්ම නිශේධනය වේ.

පස්වන වගඋත්තරකරු *"බර වැඩ හෝ දඬුවම් සරඹ කිරීමේදී මෙවැනි දෙයක් (දත් ගැලවීමක්) සිදුවීම සාමාන්‍ය නොවන බව"* සඳහන් කර ඇත. නමුත්, මෙම සිදුවීමෙන් පසුව පළමුවන වගඋත්තරකාර මධුෂාන්ව වහාම රැඳවුම් රාජකාරිවලින් ඉවත් කර ගේට්ටුවේ මුර රාජකාරි සඳහා යෙදවීමට කටයුතු කර තිබේ. යම් හෙයකින් මෙය වගඋත්තරකරුවන් පවසන පරිදි "අනතුරක්" හෝ "දතක රිදීමක්" පමණක් වූයේ නම්, රාජකාරි නියුතු නාවිකයෙකුගේ රාජකාරි ස්ථානය වහාම වෙනස් කිරීමේ අවශ්‍යතාවයක් මතු නොවන බව නිරීක්ෂණය වේ.

වින්දිතයා පවසන පරිදි, ඔහු රෝහල්ගතව සිටියදී ජ්‍යෙෂ්ඨ නාවිකයින් හරහා අණභාර නිලධාරියා විසින් තර්ජනය කරමින්, "සත්‍ය හෙළි කළහොත් දඬුවම් කාලය වැඩි කරන බව" පැවසීම සහ පසුව බලහත්කාරයෙන් ලේඛනගත ප්‍රකාශ ලබා ගැනීම පිළිබඳ චෝදනා, වගඋත්තරකරුවන්ගේ පරස්පර සාක්ෂි හමුවේ තවදුරටත් ශක්තිමත් වේ. විශේෂයෙන්ම, 1991 නාවික හමුදා රැඳවුම් නියෝග 36 ප්‍රකාරව මේ සම්බන්ධයෙන් කිසිදු සටහනක් රැඳවුම් ජර්නලයේ තැබීමට වගඋත්තරකරුවන් කටයුතු කර නොමැති වීම තුළින්ම , සිද්ධියට වසන් කිරීමට උත්සාහ කර ඇති බව නිරීක්ෂණය වේ.

19. අනාවරණය වූ කරුණු අනුව, නාවික හමුදා 'චරිත ශෝධනාගාරය' තුළ රැඳවියන් පාලනය කිරීම උදෙසා පොලු මුගුරු භාවිතය, නිදි වැරවීම මඟින් පීඩා කිරීම සහ වතුර ප්‍රහාර එල්ල කිරීම වැනි අමානුෂික හා නීති විරෝධී ක්‍රමවේදයන් නිල නොවන මට්ටමින් ක්‍රියාත්මක වන බව නිරීක්ෂණය වේ. විශේෂයෙන්ම, මෙම පහරදීම සිදු වන අවස්ථාවේදී වගකිව යුතු අනෙකුත් නිලධාරීන් එම ස්ථානයේ රැඳී සිටීම තුළින් සනාථ වන්නේ, මෙය හුදෙක් එක් නිලධාරියෙකුගේ අත්තනෝමතික ක්‍රියාවක් නොව ඉහළ නිලධාරීන්ගේ නිහඬ අනුමැතිය හෝ අනුදැනුම සහිතව සිදු වූවක් බවයි.

වින්දිතයා දරුණු පහරදීමකට ලක්ව, දත් අහිමි වී වමනය යන තත්ත්වයක සිටියදී පවා, වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම පැය 04 කට ආසන්න කාලයක් ප්‍රමාද කිරීම සාපරාධී නොසලකා හැරීමක් ලෙස හැඳින්විය හැකිය. තව ද, වින්දිතයා සතුව තිබුණේ 'කෘත්‍රිම දත්' බව පවසමින් බලහත්කාරයෙන් ලේඛනගත ප්‍රකාශ

ලබා ගැනීමත්, නීතිමය ක්‍රියාමාර්ගවලට එරෙහිව වින්දිතයාට තර්ජනය කිරීමත් හරහා නාවික හමුදා බලධාරීන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට බාධා පමුණුවා ඇත.

මෙම පහරදීමෙන් පසුව වින්දිතයා 'සයටිකා' (Sciatica) රෝගී තත්ත්වය ඇති වීම, ඔහුගේ ඉදිරි වෘත්තීය ජීවිතයට මෙන්ම පෞද්ගලික ජීවිතයේ ගුණාත්මකභාවයට ද බලපෑමක් එල්ල කරන ස්ථිර හෝ දීර්ඝකාලීන ආබාධයක් බව නිරීක්ෂණය වේ.

20. වින්දිතයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, මහබාගේ පොලීසිය, අධිකරණ වෛද්‍ය නිලධාරී සහ නාවික හමුදා රෝහල් වෛද්‍යවරයා වෙත ලබා දී ඇති ප්‍රකාශයන්හි අන්තර්ගතය පූර්ණ ලෙස සමපාත වන අතර, ඒවායේ කිසිදු පරස්පරතාවක් නිරීක්ෂණය නොවේ. එසේ වුවද, පළමුවන වගඋත්තරකරු විසින් ඉදිරිපත් කරන ලද කරුණු විමසීමේදී ඔහු අවස්ථා කිහිපයකදී පරස්පර විරෝධී ස්ථාවරයන් ගෙන ඇති බව පෙනී යයි.

විශේෂයෙන්ම, වගඋත්තරකරු මෙම පහරදීම සිදු කළ බවට කොමිෂන් සභාව හමුවේ මුල් අවස්ථාවේදී සිදු කළ පිළිගැනීමත්, පසුව මිනිත්තු 20 ක පමණ කාලයක් දඬුවම් සරඹ (ඩිප් ගැසීම සහ දිවීම වැනි) ලබා දෙන අතරතුර වින්දිතයාගේ දත් ඉබේ ගැලවී ගිය බවට කරන ලද ප්‍රකාශයත්, ඉන් අනතුරුව 2024.08.26 දින අධිකරණයේදී ඔහු වින්දිතයාට කම්මුල් පහරක් දුන් බවට කරන ලද පාපොච්චාරණයත් අතර පැහැදිලි පරස්පරතාවක් පවතී. වගඋත්තරකරුගේ මෙම පරස්පර ප්‍රකාශයන් මඟින් ගම්‍ය වන්නේ, ඔහු මෙම අමානුෂික පහරදීමේ සැබෑ බරපතලකම වසන් කිරීමට සහ තමා වෙත පැවරෙන සාපරාධී වගකීමෙන් බැහැර වීමට නිරන්තර උත්සාහයක නිරත වී ඇති බවයි.

එසේ වුවද, වෛද්‍ය වාර්තා, අධිකරණ වෛද්‍ය නිගමන සහ මහබාගේ පොලීසිය වෙත ඉදිරිපත් කර ඇති සාක්ෂි මඟින් විමර්ශනාත්මකව සනාථ වන්නේ, සානැවි (විපා) එස්.ආර්.එම්. මධුෂාන් විසින් නාවික හමුදා චරිත ශෝධනාගාරය තුළදී සිදු කරන ලද අමානුෂික පහරදීම හේතුවෙන් වින්දිත පී.ඒ.අයි.කේ. කුමාර හට මෙකී දත් අහිමි වන පරිදි බරපතල තුවාල සිදුව ඇති බවයි. වගඋත්තරකරු පවසන පරිදි සාමාන්‍ය දඬුවම් සරඹයක් අතරතුර දත් අහිමි වීමක් සිදුවිය නොහැකි බවත්, එය මොට බලය යෙදීම සහිත පහරදීමක සෘජු ප්‍රතිඵලයක් බවත් වෛද්‍ය නිගමන මඟින් තහවුරු වී ඇත.

21. එස්.ආර්.එම්. මධුෂාන් විසින් වින්දිතයා වෙත පහරදීම් සිදු කර ඇති බව සාක්ෂි මඟින් සනාථ වන අතර, ඔහු විසින් නාවික චරිත ශෝධනාගාරයේ දඬුවම් ලබමින් සිටි දෙවන වගඋත්තරකරු එල්.එම්. සේනාධීර නැමැත්තාට නියෝග කරමින්, වින්දිතයාට පහර දීමට පොළඹවා ඇති බව නිරීක්ෂණය වේ. ඒ අනුව, මධුෂාන් නැමැත්තාගේ සෘජු පාලනය සහ බලපෑම යටතේ සිටි සේනාධීර විසින් ද වින්දිතයා වෙත ලී පොල්ලකින් පහරක් එල්ල කර ඇත.

එසේ වුවද, එකී පහරදීම පළමුවන වගඋත්තරකරුගේ සෘජු නියෝගය සහ බලහත්කාරී බලපෑම මත සිදු වූවක් බැවින් ද, එය පෞද්ගලික චේතනාවකින් හෝ නීත්‍යානුකූල දඬුවම් පැමිණවීමේ අවශ්‍යතාවයකින් තොරව සිදු කරන ලද්දක් බැවින් ද, සේනාධීර නැමැත්තා මෙම සිදුවීමට අදාළ වගකීමට යටත් කරනු නොලබයි.

22. මෙම පහරදීම නාවික හමුදා චරිත ශෝධනාගාරය තුළදී සිදු වූවක් බව පිළිගන්නා අතරම, පහරදීමට සම්බන්ධ නිලධාරියා පෞද්ගලිකව නම් කර ඇති බැවින් නාවික හමුදාධිපතිවරයා මෙහි වගඋත්තරකරුවකු ලෙස නම් කළ නොහැකි බව නාවික හමුදාව මුලින් ලිඛිතව දන්වා තිබුණි. එසේම, අදාළ නිලධාරියා වෙනුවෙන් නාවික හමුදාව පෙනී නොසිටින බවට ද ස්ථාවරයක් ගෙන තිබුණි. එහෙත්, විමර්ශන ක්‍රියාවලියේ දී නාවික හමුදාව මෙම ස්ථාවරය පරස්පර ලෙස වෙනස් කර ඇති බව නිරීක්ෂණය

වේ. විශේෂයෙන්ම, අධිකරණය හමුවේ නඩුවක් පවතින බව පවසමින් මෙම පැමිණිල්ල නිෂ්ප්‍රභ කිරීමට උත්සාහ කිරීමත්, 2025.02.21 දින නාවික හමුදාධිපතිවරයා වෙනුවෙන් පෙනී සිටි නීති නිලධාරියා විසින් වගඋත්තරකරු නිවැරදිකරු බව පෙන්වීමට ඔහුගේ ප්‍රකාශ සංශෝධනය කිරීමට උත්සාහ කිරීමත් හරහා, නාවික හමුදාව මෙම වධහිංසාව සාධාරණීකරණය කිරීමට හෝ වසන් කිරීමට සෘජුවම මැදිහත් වී ඇති බව පෙනී යයි.
එමෙන්ම, වින්දිතයා නාවික හමුදා භාරයේ සිටි රැඳවියෙකු බැවින්, ඔහුගේ ශාරීරික අඛණ්ඩතාව ආරක්ෂාව තහවුරු කිරීමට නාවික හමුදාව නෛතිකව බැඳී සිටී. එසේ තිබියදී, වින්දිතයාට අහිමි වූයේ කෘත්‍රිම දත් බවට බලහත්කාරයෙන් ලිඛිත ප්‍රකාශ ලබා ගැනීමත්, නාවික හමුදා වෛද්‍ය වාර්තා තුළ 'දන්ත පාලමක්' (Bridges) යන වචනය භාවිතා කරමින් තුවාලයේ බරපතලකම අවතක්සේරු කිරීමට උත්සාහ කිරීමත් බලාපොරොත්තු නොවිය හැකි ක්‍රියාවකි. මෙවැනි ක්‍රියාමාර්ග හරහා නාවික හමුදා රෝහල ඇතුළු අභ්‍යන්තර ආයතන, යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට බාධා කරමින් වගකීමෙන් බැහැර වීමට කටයුතු කරන බව නිරීක්ෂණය වේ.

නාවික හමුදා අභ්‍යන්තරයේ සිදුවන මෙවැනි මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වසන් කිරීම සාමාන්‍ය ක්‍රියාපටිපාටියක් බවට පත්වීමට ඉඩ දිය නොහැක. නාවික හමුදා පනත සහ අදාළ රෙගුලාසි ප්‍රකාරව චරිත ශෝධනාගාරවල පාලනය සහ රැඳවියන්ගේ සුරක්ෂිතභාවය පිළිබඳ සෘජු වගකීම නාවික හමුදාධිපතිවරයා සතු වන බැවින්, තම යටතේ සිටින නිලධාරීන් විසින් සිදු කරනු ලබන මෙවැනි වධහිංසාවන් සම්බන්ධයෙන් නාවික හමුදාධිපතිවරයා 'විධායක වගකීමෙන්' බැඳී සිටියි.

23. <u>*අමල් සුදත් සිල්වා එදිරිව පොලිස් පරීක්ෂක කොඩිතුවක්කු මෙන්ම ඩිල්ෂාන් තිලකරත්න සහ වයි. කුමාරිහාමි එදිරිව සාජන් ඩග්ලස් ඇල්ලේපොල සහ තවත් අය (SCFR 578/2011)*</u> යන නඩු තීන්දු මඟින් ශ්‍රේෂ්ඨාධිකරණය, පුද්ගලික නිදහස සහ ආරක්ෂාව පිළිබඳ ව්‍යවස්ථාමය සහතිකය සෑම පුරවැසියෙකුටම එක හා සමානව හිමිවිය යුතු බව සඳහන් කර ඇත. එහිදී, යම් පුද්ගලයෙකු සුප්‍රකට හෝ දරුණු අපරාධකරුවෙකු වුව ද, ඔහු වධහිංසාවට, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුතු බව අධිකරණය අවධාරණය කර ඇත. මෙම මූලධර්මය වර්තමාන පැමිණිල්ලේ වින්දිත නාවිකයාට ද අදාළ වන අතර, ඔහු විනය වරදක් සම්බන්ධයෙන් රැඳවුම් භාරයේ සිටිය ද, ඔහුගේ ශාරීරික අඛණ්ඩතාව උල්ලංඝනය කිරීමට වගඋත්තරකරුවන්ට කිසිදු නෛතික අවසරයක් නොමැත.

24. <u>*සංජීව එදිරිව සුරවීර (SCFR 328/2002)*</u> යන නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ලබා දුන් තීන්දුව ප්‍රකාරව, නිලධාරීන් විසින් යොදවන ලද බලය හේතුවෙන් හෝ වෙනත් අයුරකින් තුවාල ලැබූ පුද්ගලයෙකු වහාම වෛද්‍ය ප්‍රතිකාර සඳහා යොමු කිරීමට අපොහොසත් වීම, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව යටතේ ගැනෙන කෲර හා අමානුෂික සැලකිල්ලක් ලෙස නිගමනය කර ඇත. මෙම සිදුවීමේදී ද වින්දිතයා පහරදීමකට ලක්ව මුඛයෙන් රුධිරය වහනය වන තත්ත්වයක සිටියදී පවා, වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම පැය කිහිපයක් ප්‍රමාද කිරීම තුළින් වගඋත්තරකරුවන් මෙම නෛතික පූර්වාදර්ශය උල්ලංඝනය කර ඇති බව පෙනී යයි.

25. <u>*ආර්.ඒ. ඉරේෂා ලක්මාලි එදිරිව නෙවිල් සිල්වා, කොළඹ අපරාධ කොට්ඨාශය සහ තවත් අය (SCFR 505/19)*</u> නඩුවේදී විනිසුරු තුරෙයිරාජා මහතා පෙන්වා දුන්නේ, තමන් යටතේ සිටින නිලධාරීන් නීතියට අනුකූලව කටයුතු කරන්නේදැයි අධීක්ෂණය කිරීම උසස් නිලධාරීන්ගේ වගකීමක් බවයි. යටත් නිලධාරීන් මූලික අයිතිවාසිකම් කඩ කරද්දී ඔවුන්ව වගවීමකට ලක් නොකරන උසස් නිලධාරීන් ද එම උල්ලංඝනයන්ට වගකිව යුතු බවත්, එවැනි නිලධාරීන්ට එරෙහිව විනය පියවර නොගැනීම මඟින් 'දණ්ඩ මුක්තියේ' සංස්කෘතියක් නිර්මාණය වන බවත් එහිදී තීන්දු විය. ඒ

අනුව, වධහිංසාව සිදු වන අවස්ථාවේ එම ස්ථානයේ සිටි සහ පසුව එය වසන් කිරීමට උත්සාහ කළ නාවික හමුදාවේ අණභාර නිලධාරීන් ද මෙම වගකීමෙන් බැඳෙන බව නිරීක්ෂණය වේ.

26. *පෙරේරා එදිරිව මේජර් ජෙනරාල් ජයවර්ධන (1991) 2 Sri L.R. 251* නඩුවේදී ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා පැහැදිලිව තීරණය කර ඇත්තේ, සන්නද්ධ හමුදාවල සාමාජිකයන්ට ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයෙන් සහතික කර ඇති මූලික අයිතිවාසිකම් භුක්ති විඳීමේ පූර්ණ අයිතිය පවතින බවයි. හමුදා විනය පාලනය කිරීමේ අවශ්‍යතාවය කිසිදු විටෙක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති මානුෂීය අයිතිවාසිකම් යටපත් කිරීමට හේතුවක් නොවන බව මෙමඟින් තහවුරු වේ.

27. *සිල්වා එදිරිව සභාපති, පොහොර සංස්ථාව (1989) 2 SLR 393* නඩුවේදී විනිසුරු අමරසිංහ මහතා නිරීක්ෂණය කළේ, 11 වන වගන්තිය යටතේ ගැනෙන "සැලකිල්ල" යන්න හුදෙක් ශාරීරික හිංසනයට පමණක් සීමා නොවන අතර, පුද්ගලයෙකුගේ ආත්මයට සහ මනසට (Soul and Mind) සිදු කරන හානිය ද ඊට ඇතුළත් වන බවයි. වින්දිතයා රෝහල්ගතව සිටියදී ඔහුට සිදුකළ තර්ජනය කිරීම් සහ ඔහුගේ දත් කෘත්‍රිම බව පැවසීමට සිදුකළ බලපෑම්, මෙම පූර්වාදර්ශය අනුව මානසික වධහිංසාවක් ලෙස වර්ගීකරණය කළ හැකිය.

<u>නිගමනය</u>

පැමිණිලිකාර පාර්ශවය සහ වගඋත්තරකරුවන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු මෙන්ම, විමර්ශනයේදී අනාවරණය වූ ලේඛනගත සාක්ෂි, නාවික හමුදා අභ්‍යන්තර ලොග් සටහන් සහ අධිකරණ වෛද්‍ය වාර්තා, නාවික හමුදා වෛද්‍ය වාර්තා සමස්තයක් ලෙස විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව පහත නිගමනයන්ට එළඹෙන ලදී.

පළමුවන වගඋත්තරකාර සානැවි (විපා) එස්.ආර්.එම්. මධුෂාන් විසින් වැලිසර නාවික හමුදා චරිත ශෝධනාගාරය තුළදී, වින්දිත නායක නැවි පී.ඒ.අයි.කේ. කුමාර වෙත එල්ල කරන ලද පහරදීම හේතුවෙන් වින්දිතගේ ඉහළ හනුවේ මැද කෘන්තක දත් යුගලය අහිමි කිරීම හා ඉහළ හනුවේ දකුණු පස පාර්ශවීය කෘන්තක දත කැඩීම බරපතල තුවාල සිදුකිරීමක් බව අධිකරණ වෛද්‍ය වාර්තාව මඟින් තහවුරු වේ. ඒ අනුව, පළමුවන වගඋත්තරකරු විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති, *"කිසිම තැනැත්තකු වධහිංසාවලට හෝ කෲර, අමානුෂික හෝ අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමකට යටත් නොකළ යුත්තේය"* යන මූලික මානව අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමි.

වින්දිතයා නාවික හමුදා පාලනය යටතේ පවතින ශ්‍රී ලංකා නාවික නෞකා වැලිසර ආයතනයට අදාළ රැඳවුම් මධ්‍යස්ථානයක (චරිත ශෝධනාගාරයක) භාරයේ සිටි රැඳවියෙකු බැවින්, ඔහුගේ ශාරීරික අඛණ්ඩතාව සහ ආරක්ෂාව සහතික කිරීමේ පූර්ණ වගකීම නාවික හමුදා පාලනාධිකාරිය සතු වේ. 1991 නාවික හමුදා රැඳවුම් නියෝග (විශේෂයෙන් 03, 33, 34, 36 සහ 37 වන නියෝග) උල්ලංඝනය කරමින්, රැඳවියන්ට 'සණ සරඹ' ලබාදීමේ මුවාවෙන් අතින් හෝ වෙනත් මොට ආයුධ මඟින් පහර දීම වැනි අනීතික දඬුවම් ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීමට විනය පාලක නාවිකයන්ට ඉඩ හැරීම තුළින්, චරිත ශෝධනාගාර අණභාර නිලධාරී කමාන්ඩර් මුණිදාස සිය විධායක සහ අධීක්ෂණ වගකීම පැහැර හැර ඇති බව නිගමනය කරනු ලැබේ. ඒ අනුව චරිත ශෝධනාගාර අණභාර නිලධාරී ලෙස කටයුතු කළ තෙවන වගඋත්තරකාර කමාන්ඩර් මුණිදාස, රැඳවුම් මධ්‍යස්ථානය තුළ සිදුවන වධහිංසා වැළැක්වීමට අපොහොසත් වීම, වින්දිතයාට වෛද්‍ය ප්‍රතිකාර ලබාදීම ප්‍රමාද කිරීම සහ පසුව සිද්ධිය වසන් කිරීම තුළින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්ති උල්ලංඝනය කර ඇති බව නිගමනය කරමු.

දෙවන වගඋත්තරකාර සේනාධීර විසින් වින්දිතයාට පහරක් එල්ල කර තිබුණ ද, එකී ක්‍රියාව පළමුවන වගඋත්තරකරුගේ සෘජු නියෝගය සහ බලහත්කාරී බලපෑම මත සිදු වූවක් බවත්, ඔහු ද එම අවස්ථාවේ රැඳවියෙකු ලෙස දඬුවමට යටත්ව සිටි අයෙකු බවත් නිරීක්ෂණය වේ.

සිව්වන සහ පස්වන වගඋත්තරකාර නිලධාරීන් විසින් මෙම පහරදීමේ සිදුවීම සඳහා කිසිදු සෘජු මැදිහත්වීමක් හෝ බලපෑමක් සිදු කර නොමැති බවත්, සිද්ධිය වූ අවස්ථාවේ ඔවුන් එම ස්ථානයේ රැඳී සිටි බව සාක්ෂි මඟින් තහවුරු නොවන බවත් නිරීක්ෂණය වේ. එමෙන්ම, මෙම අනීතික ක්‍රියාව සිදු කිරීම සඳහා ඔවුන් අනුබල ලබා දුන් බවට ප්‍රමාණවත් සාක්ෂි අනාවරණය නොවන අතර, ඔවුන් චරිත ශෝධනාගාර අණභාර නිලධාරියා දැනුවත් කර අදාළ උපදෙස්වලට යටත්ව කටයුතු කර ඇති බව පෙනී යයි. ඒ අනුව, සිදුව ඇති මෙම මානව හිමිකම් උල්ලංඝනය සම්බන්ධයෙන් වගකීමට සිව්වන සහ පස්වන වගඋත්තරකරුවන් යටත් කරනු නොලැබේ.

නාවික හමුදාධිපතිවරයා සිය යටත් නිලධාරීන් විසින් සිදු කරන ලද මෙම අනීතික ක්‍රියාව සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ දැනුවත් කිරීමවලින් පසුව ද විමර්ශන සඳහා නිසි සහයෝගයක් ලබා නොදීමත්, එවැනි ක්‍රියාවන් සම්බන්ධයෙන් වගවීම තහවුරු කිරීමට අපොහොසත් වීමත් අවධානයට ලක් වේ. වින්දිතයා නාවික හමුදා භාරයේ සිටියදී ඔහුගේ ශාරීරික අඛණ්ඩතාව සහ මූලික මානුෂීය අයිතිවාසිකම් සුරක්ෂිත කිරීමට ප්‍රමාණවත් පියවර නොගැනීම සහ සිය විධායක අධීක්ෂණ වගකීම පැහැර හැරීම තුළින්, නාවික හමුදාධිපතිවරයා විසින් ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) වගන්තියෙන් සහතික කර ඇති *"නීතිය ඉදිරියේ සමාන රැකවරණය ලැබීමේ"* මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බව නිගමනය කරයි.

ඒ අනුව කොමිෂන් සභාව විසින් පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරනු ලැබේ.

1. පළමුවන වගඋත්තරකාර සානැවි (විපා) එස්.ආර්.එම්. මධුශාන් විසින් රු.50,000.00 මුදලක් වින්දිත වෙත ගෙවිය යුතුය.

2. මෙම පහරදීමෙන් බරපතල තුවාල සිදු කිරීම පිළිබඳව පරීක්ෂා කොට, පළමුවන වගඋත්තරකරුට එරෙහිව සුදුසු නීතිමය පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතුවේ.

3. මෙම වධහිංසා පැමිණවීම සම්බන්ධයෙන් සෘජුව වගකිව යුතු එස්.ආර්.එම්. මධුශාන් සම්බන්ධව 1994 ජනවාරි 28 වන දිනැති අංක 803/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා නාවික හමුදාධිපතිවරයා විසින් ස්වාධීන අභ්‍යන්තර පරීක්ෂණයක් පවත්වා, නාවික හමුදා පනතට අනුකූලව ක්‍රියාමාර්ග ගත යුතුය.

4. චරිත ශෝධනාගාර අණභාර නිලධාරී ලෙස කටයුතු කළ තෙවන වගඋත්තරකාර කමාන්ඩර් මුණිදාස, සිය අධීක්ෂණ වගකීම පැහැර හැරීම සම්බන්ධයෙන් නාවික හමුදා පනතට අනුකූලව පරීක්ෂණයක් පවත්වා ක්‍රියාමාර්ග ගත යුතුය. තව ද වින්දිතයාට සිදු වූ වධහිංසාව සාධාරණීකරණය කිරීමට උත්සාහ කළ සහ විමර්ශනයට බාධා කළ අනෙකුත් නිලධාරීන් සම්බන්ධයෙන් ද ආයතනික මට්ටමින් විමර්ශනයක් පවත්වා පියවර ගත යුතුය.

5. නාවික හමුදා චරිත ශෝධනාගාර තුළ රැඳවියන් සඳහා නියමිත 'බර වැඩ' සහ 'සණ/ දඬුවම් සරඹ'වලින් බැහැරව වධහිංසා පමුණුවන ඕනෑම ක්‍රියාවක් වහාම තහනම් කළ යුතු අතර ඒ පිළිබඳ නව චක්‍රලේඛයක් මඟින් නාවික හමුදාධිපති විසින් සියලු නිලධාරීන් දැනුවත් කළ යුතුය. 1991 නාවික හමුදා රැඳවුම් නියෝග අංක 36 සහ 37 ප්‍රකාරව, රැඳවියන් ඇතුළත් කිරීමේදී සහ මුදා හැරීමේදී අනිවාර්ය

වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කිරීමේ සහ දඬුවම් විධිමත්ව ලේඛනගත කිරීමේ විනිවිදභාවයකින් යුතු ක්‍රියාවලියක් නාවික හමුදාධිපතිවරයා විසින් ස්ථාපිත කළ යුතුය.

6. චරිත ශෝධනාගාර වෙත යොමු කරනු ලබන නාවික පුද්ගලයන් මෙවැනි අමානුෂික වධහිංසාවලට ලක්වීම වැළැක්වීම සඳහා, 1994 ජනවාරි 28 වන දිනැති අංක 803/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ විධිවිධානවලට අනුකූලව අදාළ රැඳවුම් පහසුකම්වල ක්‍රියාකාරීත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීමේ සුදුසු වැඩපිළිවෙළක් ශ්‍රී ලංකා නාවික හමුදාව විසින් ක්‍රියාත්මක කළ යුතුය.

7. මූලික මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම සහ වධහිංසා වැළැක්වීම සම්බන්ධයෙන් නාවික හමුදා විනය පාලක නිලධාරීන් සහ සෙසු නිලයන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් ක්‍රමවත්ව ක්‍රියාත්මක කළ යුතුය.

2026.07.22 දින පෙර මෙකී නිර්දේශ ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශ ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශ ක්‍රියාත්මකවීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී. දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු( හිටපු),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
ජ්‍යෙෂ්ඨ නීතිඥ,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත :

1. අමාත්‍යතුමා
ආරක්ෂක අමාත්‍යාංශය
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ - කරුණු දැන ගැනීම සඳහා.

2. නාවික හමුදාධිපති
ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය
කොළඹ - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා

3. පොලිස්පතිතුමා
පොලිස් මූලස්ථානය, කොළඹ 02 - නිර්දේශ ප්‍රකාරව සුදුසු පියවර ගැනීම සඳහා